# 1991 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු හා ප්‍රතිපත්ති

1991 දී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි කැපී පෙනුනු වැදගත් ලක්ෂණයන් වූයේ ඉහළ වර්ධන වේගයක් පවත්වා ගැනීමත් උද්ධමන වේගය සැලකිය යුතු ලෙස පහත වැටීමත් සහ ගෙවුම් තුලනයේ සමස්ත වශයෙන් පුළුල් වූ අතිරික්තයක් පෙන්නුම් කිරීමත්ය. පසුගිය වසරේ වාර්තා වූ සියයට 6.2 ක වර්ධනයට අමතර ව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 4.8 කින් වර්ධනය වී ඇතැයි ගණන් බලා ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද.) වෙනස්වීම් අනුව ගණනය කරන ලද වාර්ෂික සාමාන්‍ය උද්ධමන වේගය පසුගිය වර්ෂයේදී සියයට 21 සිට 1991 දී සියයට 12 දක්වා තියුණු ලෙස පහළ වැටුණි. පසුගිය වසරේ පැවති විගැහි දශ ලක්ෂ 130 ක අතිරික්තය අනුව යමින් ගෙවුම් ශේෂයෙහි විගැහි දශ ලක්ෂ 150 ක සමස්ත අතිරික්තයක් ඇති විය. කෙසේ වෙතත් රාජ්‍ය මූල්‍ය කටයුතුවල බලාපොරොත්තු වූ අයුරින් සමහර ඉලක්ක ඉටු කර ගැනීමට නොහැකි වූ අතර 1991 වසරේදී මූල්‍යමය වෙනස් වීම් තවදුරටත් අයහපත් තත්ත්වයක පැවතුණි.

අයහපත් හා අවිනිශ්චිත ජාත්‍යන්තර වාතාවරණයක් තිබියදීත් තරමක අඩු මට්ටමක් යටතේ වුවද, පසුගිය වසරේ ලබාගත් ආර්ථික වර්ධන ක්‍රියාවලිය තව දුරටත් පවත්වා ගැනීමට 1991 දී ද ශ්‍රී ලංකා ආර්ථිකයට හැකි විය. පසුගිය වසරේ සියයට 6.2 ක වර්ධනය සමග සසඳන විට 1991 දී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) මූර්ත වශයෙන් සියයට 4.8 කින් වැඩි වී ඇතැයි ගණන් බලා ඇත. ශුද්ධ විදේශ සාධක ආදායම ගැලපීමෙන් ගණනය කරනු ලබන මූර්ත දළ ජාතික නිෂ්පාදිතයද (මු.ද.ජා.නි.) මෙම උපනතියට අනුව යමින් 1990 වාර්තා වූ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ සියයට 6.4 ක වර්ධන වේගය සමග සසඳන කල සියයට 4.7 ක වර්ධන වේගයක් පෙන්නුම් කරන ලදී.

**1.1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදායම් සංඛ්‍යා 1989 - 1991**


| ශීර්ෂය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය සියයට | |
|---|---|---|---|---|---|
| | 1989 | 1990* | 1991* | 1990* | 1991* |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 228,138 | 290,495 | 339,058 | 27.3 | 16.7 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 121,729 | 129,244 | 135,389 | 6.2 | 4.8 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 222,399 | 283,810 | 331,742 | 27.6 | 16.9 |
| 4. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 118,874 | 126,426 | 132,425 | 6.4 | 4.7 |
| 5. මැදි වසර ජනගහණය (1000) .. | 16,806 | 16,993 | 17,247 | 1.1 | 1.5 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය .. | | | | | |
| (i) පවත්නා මිළ අනුව (රුපියල්) .. | 13,293 | 16,702 | 19,235 | 25.6 | 15.2 |
| (ii) ස්ථාවර මිළ අනුව (රුපියල්) .. | 7,073 | 7,440 | 7,678 | 5.2 | 3.2 |

* තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1990 වසරෙහි තරම් නොවුවද, 1991 වර්ධන ක්‍රියාකාරීත්වය තව දුරටත් සැළකිය යුතු අයුරින් ඉහළ මට්ටමක පැවතුණි. එය ලබා ගැනීමට හැකි වූයේ ප්‍රධාන කෘෂිකාර්මික භෝගයන්ගේ නිෂ්පාදනවල දරුණු පසු බැසීමක් මෙන්ම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපලේ අඩු වැදගත්කමක් ඇති කල අසතුටුදායක හා අවිනිශ්චිත ජාත්‍යන්තර වාතාවරණයක් තුලය. පුළුල් කරන ලද ආර්ථික කටයුතු නිදහස් කිරීමේ පියවරයන් හා ප්‍රතිපත්තිමය වෙනස් කිරීම්වලට සංවේදීව ජනිත වූ වර්ධන ක්‍රියාවලිය තව දුරටත් පවත්වා ගෙන යෑමට හැකි වූ බවක් එමගින් තහවුරු කෙරුණි.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

1991 දී පවත්නා සාධක වියදම් මිල අනුව රුපියල් බිලියන 332 ක් යැයි ගණන් බලා ඇති දළ ජාතික නිෂ්පාදිතය පසුගිය වසරට වඩා සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කළේය. ආර්ථිකයේ සමස්ත මිල වෙනස්වීම් පිළිබිඹු කරන ගම්‍ය දළ ජාතික නිෂ්පාදිත අවධමනකය, 1990 වාර්තා වූ සියයට 20 ක වැඩි වීමට වඩා සැළකිය යුතු ලෙස අඩු වෙමින් සියයට 11.6 කින් ඉහළ නැගුණි. මේ අනුව දළ ජාතික නිෂ්පාදිතය (1982) ස්ථාවර සාධක මිල ගණන් අනුව පසුගිය වසරට වඩා සියයට 4.7 ක වර්ධනයක් පෙන්වමින් රුපියල් බිලියන 132 ක් ලෙස ගණන් බලා ඇත.

රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1991 දී ශ්‍රී ලංකාවේ ජනගහනය දශ ලක්ෂ 17.25 දක්වා සියයට 1.5 කින් වැඩි විය. මේ අනුව 1991 දී පවත්නා මිල ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය පසුගිය වසරට වඩා සියයට 15.2 ක වර්ධනයක් පෙන්වමින් රුපියල් 19,235 (අ.එ.ජ.ඩොලර් 465) ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. ස්ථාවර මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වැඩි වීම සියයට 3.2 ක් විය.

දළ දේශීය ඉතිරි කිරීම්, 1990 දී රුපියල් බිලියන 46.1 සිට 1991 දී රුපියල් බිලියන 48 දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇති නමුත් වෙළෙඳ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් විට 1990 දී සියයට 14.3 සිට 1991 දී සියයට 12.8 දක්වා පහළ වැටී ඇත. මේ අතර වෙළෙඳ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස ගැනෙන ජාතික ඉතිරි කිරීම් අනුපාතය 1990 දී සියයට 16.8 සිට 1991 දී සියයට 15.2 දක්වා පහළ වැටුණි.

තොග වෙනස්වීම්ද ඇතුළත් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි (ද.දේ.ප්‍රා.ස.) 1990 දී සියයට 30.6 කින් වැඩි වීම හා සසඳන කල 1991 දී සියයට 20.9 ක වැඩිවීමක් වාර්තා කරමින් ප්‍රාග්ධන සම්පාදන අනුපාතිකයෙහි ආන්තික වැඩිවීමක් පිළිබිඹු කෙරුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1990 දී සියයට 22.2 සිට 1991 දී සියයට 23 දක්වා ඉහළ නැගුණි. පසුගිය වසර දෙකෙහි රටාවට සමානව යමින්, 1991 වසරෙහිද ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැඩි දායකත්වයක් ලැබුණේ පෞද්ගලික අංශයෙනි. පෞද්ගලික අංශයෙහි සහ රාජ්‍ය සංස්ථාවන්හි ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය පසුගිය වසරේ සියයට 43.4 ක වැඩිවීම හා සසඳන කළ 1991 දී ඉහළ නැගුණේ සියයට 20.3 කිනි. 1991 දී පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි වශයෙන් යොදවන ලද්දේ නිමැවුම් කර්මාන්ත, ප්‍රවාහන, පණිවුඩ හුවමාරු සහ ඉදි කිරීම් යන ප්‍රධාන අංශවලය.

ආංශික වශයෙන් වර්ධන ක්‍රියාකාරීත්වය විග්‍රහ කිරීමේදී නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන්, 1991 දී ප්‍රධාන වර්ධක අංශයන් බවට පත් වී තිබුණි. මෑත කාලයේ වාර්තා ගත වූ වර්ධන තත්ත්වයන් පවත්වා ගනිමින්, නිමැවුම් අංශය 1991 දී සියයට 6.9 ක වර්ධන අනුපාතයක් වාර්තා කළ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ සමස්ත වර්ධනයට සියයට 25 කින් පමණ දායක විය. නිමැවුම් කර්මාන්ත අංශය තුළ අපනයනාභිමුඛ, රෙදිපිළි හා මසා නිම කළ ඇඳුම් කර්මාන්තය, ප්‍රධාන කොටගත් කම්හල් කර්මාන්තවල එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 9.5 කින් වර්ධනය විය. වසර කිහිපයකට පෙර දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතියෙන් කෘෂිකාර්මික අංශය හිමි කරගෙන තිබූ මට්ටම හා සසඳා බලන කල වර්තමානයේදී ශ්‍රී ලංකාවේ වර්ධන ක්‍රියාකාරිත්වය තීරණය වීමේදී නිමැවුම් කර්මාන්ත අංශයේ වැදගත්කම වර්ධනය වෙමින් පවතින බව මෙම දත්තයන් මගින් පෙන්නුම් කෙරේ.

1990 දී සියයට 4.3 කින් වර්ධනය වූ සේවා අංශය 1991 දී සියයට 6.1 ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කරනු ලැබුණි. මෙම අංශය තුළ බැංකු සහ රක්ෂණ, අනෙකුත් මූල්‍ය සේවාවන්, වෙළඳාම, ප්‍රවාහන සහ පණිවුඩ හුවමාරුව යන අංශවල ඉහළ වර්ධනයක් වාර්තා විය. විමසුමට භාජනය වන වසර තුළ සේවා අංශයේ වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්නව සියයට 64 ක වැඩිවීමක් ලෙස ගණන් බලා ඇත.

### 1.2 සංඛ්‍යා සටහන

**දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1989 - 1991**
**ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව**

| අංශ | වටිනාකම රු. දශ ලක්ෂ | | | වර්ධන අනුපාතිකය | | |
|---|---|---|---|---|---|---|
| | 1989 | 1990* | 1991* | 1989 | 1990* | 1991* |
| 1. කෘෂිකර්මය, වන හා ධීවර .. | 27,666 | 30,011 | 30,869 | - 1.1 | 8.5 | 2.9 |
| 1.1 තේ .. | 2,668 | 3,004 | 3,100 | - 8.8 | 12.6 | 3.2 |
| 1.2 රබර් .. | 697 | 718 | 655 | - 9.5 | 3.0 | - 8.8 |
| 1.3 පොල් .. | 3,210 | 3,261 | 2,827 | 28.3 | 1.6 | -13.3 |
| 1.4 වී .. | 5,258 | 6,378 | 6,301 | -16.7 | 21.3 | - 1.2 |
| 1.5 අනෙකුත් (අතුරු භෝග වන හා ධීවර ඇතුළු) .. | 15,833 | 16,650 | 17,986 | 2.3 | 5.2 | 8.0 |
| 2. පතල් සහ කැනීම් .. | 3,576 | 3,901 | 3,511 | 5.4 | 9.1 | -10.0 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 20,488 | 22,427 | 23,979 | 4.4 | 9.5 | 6.9 |
| 3.1 වෘක්ෂ භෝග සැකසීම .. | 3,257 | 3,530 | 3,328 | - 0.5 | 8.4 | - 5.7 |
| 3.2 අනෙකුත් .. | 17,231 | 18,897 | 20,651 | 5.4 | 9.7 | 9.3 |
| 4. කැනීම් .. | 8,514 | 8,761 | 8,963 | 0.6 | 2.9 | 2.3 |
| 5. සේවා .. | 61,485 | 64,144 | 68,067 | 3.2 | 4.3 | 6.1 |
| 6. ද. දේ. නි .. | 121,729 | 129,244 | 135,389 | 2.3 | 6.2 | 4.8 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | -2,855 | -2,818 | -2,964 | - | - | - |
| 8. ද. ජා. නි. .. | 118,874 | 126,426 | 132,425 | 2.3 | 6.4 | 4.7 |

* තාවකාලික. මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව.

නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන් සමග සසඳන විට කෘෂිකර්මය, පතල් හා කැනීම් සහ ඉදි කිරීම් යන අංශවල ක්‍රියාකරිත්වයෙහි පසුබෑමක් දක්නට ලැබුණි. 1991 කෘෂිකාර්මික නිෂ්පාදනවල පසුබෑමට ප්‍රධාන වශයෙන් දායක වූ සාධකයන් අතර, රබර්, පොල් හා වී, නිෂ්පාදනයන් හි පහළ වැටීම හේතුවිය. 1991 දී රාජ්‍ය අංශයේ ඉදි කිරීම් කටයුතුවල පහළ වැටීම කෙරෙහි එම අංශයේ ඇති වූ අඩු වර්ධන අනුපාතය හේතු විය.

1991 දී කෘෂිකාර්මික අංශය තුළ වර්ධන ක්‍රියාකාරිත්වයෙහි මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබුණි. තේ සහ සීනි වැනි සමහර වැදගත් භෝගයන් ඉහළම වාර්තා ගත නිෂ්පාදන මට්ටම්වලට ළඟා වූ අතර වී, රබර් හා පොල් වැනි අනෙකුත් ප්‍රධාන භෝගවල නිෂ්පාදනයෙහි පහත වැටීමක් වාර්තා කෙරුණි. පසුගිය වසර හා සසඳන විට අතුරු ආහාර භෝග අතර ලොකු ළූණු හා තල ඇට නිෂ්පාදනයෙහි වැඩිවීමක් වාර්තා කෙරුණු නමුත් අනෙකුත් අතුරු ආහාර භෝග වර්ග බොහොමයක නිෂ්පාදන මට්ටම්වල පහත වැටීමක් වාර්තා කෙරුණි. සුළු අපනයන භෝග අංශයේ, වර්ධනයෙහි මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබුණු නමුත් 1991 වර්ෂයෙහි මේ අංශයේ ක්‍රියාකාරිත්වය සමස්ත වශයෙන් ගත්විට පසුගිය වසරට වඩා යහපත් තත්ත්වයක් දක්නට ලැබුණි.

1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 233 ක ඉහළම මට්ටමක පැවති තේ නිෂ්පාදනය තවදුරටත් සියයට 3 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් 1991 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 241 ක් දක්වා වර්ධනය විය. මෙම වැඩිවීම මුළුමනින්ම ඇති වූයේ පහත් බිම් ප්‍රදේශවල කුඩා තේ වතු වලිනි. 1990 දී සියයට 27 ක වැඩිවීමක් වාර්තා වූ පහත් බිම් තේ නිෂ්පාදනය 1991 දී තවදුරටත් සියයට 11 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 116 ක් බවට පත් විය. මීට ප්‍රතිවිරුද්ධව උස් බිම් හා මැදි බිම් තේ නිෂ්පාදනය පිළිවෙළින් සියයට 4 කින් හා සියයට 1 කින් පහළ වැටුණි. යහපත් කාලගුණික තත්ත්වයන්ට අමතරව තේ නිෂ්පාදනය වැඩි වීම සඳහා ප්‍රධාන දිරි ගන්වන සුළු සාධකයක් වශයෙන්, වසරේ මුල් භාගය තුළ පැවති සිත් ඇද ගන්නා සුළු මිළ ගණන්, පහත් බිම් තේ නිෂ්පාදනයෙහි විශිෂ්ට ප්‍රගතියට හේතු විය.

1991 දී තේ නිෂ්පාදනයෙහි වැඩි වීම මුළුමනින්ම පෞද්ගලික අංශය තුළින් පිළිබිඹු කෙරුණ අතර, එය සියයට 8 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 102 ක් බවට පත් වුණි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි (ජනවසම) හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි අමු තේ දළු මිලට ගෙන කරනු ලැබූ නිෂ්පාදන ද ඇතුළත් ඒකාබද්ධ නිෂ්පාදනය වසර දෙක තුළ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 139 මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. ඒ අනුව මුළු තේ නිෂ්පාදනයෙන් රාජ්‍ය අංශයේ සාපේක්ෂ කොටස පසුගිය වසරේ සියයට 60 සිට සියයට 58 දක්වා පහළ වැටුණි. ඒ අනුව පෞද්ගලික අංශයේ තේ නිෂ්පාදනයෙහි සාපේක්ෂ කොටස සියයට 40 සිට සියයට 42 දක්වා ඉහළ නැගුණි. රාජ්‍ය සංස්ථා කම්හල්වල සැකසූ, එහෙත් පෞද්ගලික අංශය විසින් නිපදවනු ලැබූ අමු තේ දළු ද ඇතුළත් කළ විට මුළු තේ නිෂ්පාදනයෙහි පෞද්ගලික අංශයට හිමි කොටස වසර දෙක තුළ සියයට 49 සිට සියයට 50 දක්වා ඉහළ නැගුණි.

1991 දී කොළඹ තේ වෙන්දේසියේදී විකුණන ලද තේ ප්‍රමාණය සියයට 4 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 226 ක් විය. ඒ අතර 1989 සිට වර්ධනය වෙමින් පැවති කොළඹ වෙන්දේසියේ තේ මිල ගණන් 1991 ජූනි වලින් පසු තියුණු ලෙස පහත වැටීමේ උපනතියක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව කොළඹ වෙන්දේසියේ සියලුම තේ වර්ගවල සාමාන්‍ය දළ මිල ගණන් 1990 දී කිලෝ ග්‍රෑමයක් රු. 70.92 සිට 1991 දී කිලෝ ග්‍රෑමයක් රු. 58.27 දක්වා සියයට 18 කින් සැළකිය යුතු ලෙස පහළ වැටුණි. 1991 දී තේ වල සාමාන්‍ය අපනයන මිල ද (නැ.වි.ස.) කිලෝ ග්‍රෑමයක් රු. 84.12 දක්වා සියයට 8 කින් පහළ වැටුණි. පැරණි සෝවියට් සංගමය හා නැගෙනහිර යුරෝපීය රටවල් කොළඹ වෙන්දේසියට නොපැමිණීම මෙන්ම ඊජිප්තුව හා ඉරාකය විසින් සැළකිය යුතු ලෙස මිලදී ගැනීම් අඩු කිරීම තේ මිල ගණන් වල පිරිහීමට හේතු වූ ප්‍රධාන සාධකයන් විය.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (සාමූහික මට්ටමේදී) 1990 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 58.85 සිට 1991 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 62.16 දක්වා වැඩි වූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑමයකට රු. 63.15 සිට රු. 63.46 දක්වා වැඩි විය. මේ අතර සමස්තයක් වශයෙන් ගත් කළ මෙම අංශයට අදාළ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1990 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 57.65 සිට 1991 දී කිලෝ ග්‍රෑමයකට රු. 58.41 ක් දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1991 රබර් නිෂ්පාදනය 1962 සිට පැවති අඩුම නිෂ්පාදන මට්ටමට ළඟා වෙමින් සියයට 8 කින් අඩු වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 104 ක් වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. නිෂ්පාදනයෙහි පහළ වැටීමට ප්‍රධාන වශයෙන් අඩු සාමාන්‍ය පළදාව හේතු වූ අතර, සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා මාසවල නිරිතදිග ප්‍රදේශයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් සහ අඩු පොහොර භාවිතය මෙම තත්ත්වයට බලපෑ ප්‍රධාන සාධකයන් විය. රබර් නිෂ්පාදනයේ පහළ වැටීම රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයෙහිද දක්නට ලැබුණි.

වර්ධනය වූ සැපයුම් තත්ත්වයක් තුළ ලෝක ආර්ථිකයේ පසු බෑස්මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන රබර් පරිභෝජනය කරන රටවල් විසින් ක්‍රියාකාරී ලෙස ඉල්ලුම අඩු කිරීම නිසා පසුගිය වසර පහ තුළ පැවති අඩුම මට්ටමට ළඟා වෙමින් වසර මුළුල්ලේම ජාත්‍යන්තර වෙළෙඳ පොලේ රබර් මිල පහත වැටීමේ උපනතියක් පෙන්නුම් කරන ලදී. සියලුම වර්ගවල රබර් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) 1990 දී රු. 35.50 සිට 1991 දී රු. 34.55 දක්වා සියයට 3 කින් පහළ වැටුණි. කෙසේ වෙතත්, කොළඹ වෙන්දේසියේ සියලුම වර්ගවල ෂීට් රබර් සඳහා සාමාන්‍ය මිල ගණන් 1990 ට වඩා 1991 දී ඉහළ මට්ටමක පැවතුණි. කොළඹ වෙන්දේසියේ ආර්. එස්. එස්. නො. 1 හා ආර්. එස්. එස්. නො. 2 සඳහා සාමාන්‍ය මිල ගණන් පිළිවෙලින් සියයට 3 කින්, හා සියයට 7 කින් වැඩි වී කිලෝ ග්‍රෑමයක් රු. 23.59 ක් හා රු. 22.89 ක් විය. නමුත් ලේටෙක්ස් ක්‍රේප් ix වර්ගයෙහි සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයක් රු. 25.42 ක් දක්වා සියයට 10 කින් පහළ වැටුණි. රුපියලේ අගය අඩුවීම හා වසර තුළ රබර් නිර්යාත සම්බන්ධව තීරුබදු සංශෝධනය කිරීම නිසා රුපියල් වටිනාකමින් ෂීට් රබර්වල මිලෙහි ආන්තික වැඩි වීමක් සිදු විය.

රබර් පාලන දෙපාර්තමේන්තුවට අනුව පෞද්ගලික අංශයේ රබර් නිෂ්පාදන පිරිවැය 1990 දී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 17.92 සිට 1991 දී රු. 19.11 ක් දක්වා සියයට 7 කින් වැඩි

වී ඇතැයි ගණන් බලා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතුවල (සාමූහික මට්ටමේදී) නිෂ්පාදන පිරිවැය 1991 දී සියයට 5 කින් අඩු වී කිලෝග්‍රෑමයක් රු. 30.64 ක් වූ අතර ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි එය සියයට 2 කින් වැඩි වී කිලෝග්‍රෑමයක් රු. 30.11 ක් විය. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට එහි නිෂ්පාදන පාඩුව 1990 දී කිලෝග්‍රෑමයක් සඳහා රු. 8.03 සිට 1991 දී කිලෝග්‍රෑමයක් සඳහා රු. 6.79 දක්වා අඩු කර ගැනීමට හැකි විය. මීට ප්‍රතිවිරුද්ධව ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන පාඩුව 1990 දී කිලෝග්‍රෑමයකට රු. 3.34 සිට 1991 දී කිලෝග්‍රෑමයකට රු. 4.75 දක්වා වැඩි විය.

1990 දී ගෙඩි දශ ලක්ෂ 2,532 දක්වා සියයට 2 කින් ඉහළ ගිය පොල් නිෂ්පාදනය 1991 දී ගෙඩි දශ ලක්ෂ 2,184 දක්වා සියයට 14 කින් සැළකිය යුතු ලෙස පහත වැටීමක් වාර්තා කෙරුණි. පසුගිය වසරේ ප්‍රධාන පොල් වැවෙන ප්‍රදේශවල විශේෂයෙන් පොල් ත්‍රිකෝණයේ හා හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පැවති දීර්ඝ කාලීන නියඟ තත්ත්වයේ මෙන්ම අඩු පොහොර භාවිතයත් පොල් අංශයෙහි මෙම බලාපොරොත්තු කඩකරවන සුළු ක්‍රියාකාරිත්වයට හේතු වූවා විය හැකිය.

1991 දී පොල් නිෂ්පාදනයෙහි පහළ වැටීම, පොල් තෙල් හා කපාපු පොල් යන දෙවර්ගයෙහිම නිෂ්පාදන පහත වැටීමට හේතු විය. කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය 1990 දී ගෙඩි දශ ලක්ෂ 376 සිට 1991 දී ගෙඩි දශ ලක්ෂ 335 දක්වා සියයට 11 කින් පහළ වැටුණි. ඒ අතර පොල් තෙල් නිෂ්පාදනයෙහි ගෙඩි සමානය දශ ලක්ෂ 260 දක්වා සියයට 56 කින් පහළ වැටුණි. අනෙක් අතට කොප්පරා අපනයනයෙහි ගෙඩි සමානය 1990 දී ගෙඩි දශ ලක්ෂ 35.7 සිට 1991 දී ගෙඩි දශ ලක්ෂ 36 දක්වා සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. නිෂ්පාදනය අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර තුල පොල් සඳහා මෙන්ම පොල් තෙල් සඳහා දේශීය වෙළෙඳපලේ මිල ගණන් තියුණු ලෙස ඉහළ ගිය අතර, කොළඹ වෙළෙඳ පොළේ පොල් ගෙඩියක සාමාන්‍ය මිල සියයට 57 කින් වැඩි වී ගෙඩියක් රු. 3.22 ක් විය. ඒ අතර 1991 දී පොල් නිෂ්පාදනවල ජාත්‍යන්තර මිල ගණන්වල සැළකිය යුතු ඉහළ යෑමක් වාර්තා වුණු අතර, පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන වර්ග තුනෙහිම සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) 1990 දී ගෙඩියකට රු. 3.63 සිට 1991 දී ගෙඩියකට රු. 4.82 දක්වා සියයට 33 කින් වැඩි විය. ඒ අතර ඉහළ වැටුප් පිරිවැය හා අධික පොහොර මිල නිසා සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1990 දී ගෙඩියකට රු. 1.11 ක් වීම හා සසඳන විට 1991 දී ගෙඩියක් රු. 1.70 ක් දක්වා සියයට 53 ක සැළකිය යුතු වැඩිවීමක් සිදු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1990 දී සියයට 23 ක සිත් ඇදගන්නා සුළු වර්ධනයක් වාර්තා කරනු ලැබූ වී නිෂ්පාදනය 1991 දී ආන්තික පසුබෑමකට ලක් විය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 1991 වී නිෂ්පාදනය සියයට 6 ක අඩුවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.39 ක් (වී බුසල් දශ ලක්ෂ 114 ක්) විය. නිෂ්පාදනයේ පහළ වැටීම 1990/91 මහ සහ 1991 යල කන්න දෙකෙහිම දක්නට ලැබිණි.


සාමාන්‍ය ඵලදාවෙහි අඩුවීම සහ අස්වනු නෙලන ලද බිම් ප්‍රමාණයෙහි අඩුවීම 1991 වර්ෂයේ වී නිෂ්පාදනයේ අඩුවීමට බලපාන ලද කරුණු විය. 1991 දී ඇස්තමේන්තු කරන ලද සාමාන්‍ය වාර්ෂික ඵලදාව කිලෝ ග්‍රෑම් 3,398 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ සාමාන්‍ය ඵලදාවට වඩා සියයට 2 ක් අඩු විය. මේ අතර 1990 වර්ෂයේදී සියයට 20 කින් වැඩි වූ අස්වනු නෙලන ලද මුළු දළ බිම් ප්‍රමාණය 1991 දී හෙක්ටයාර් 790,664 දක්වා සියයට 5 කින් අඩු විය.

1991 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 44,368 ක් දක්වා සියයට 42 කින් වී අලෙවි මණ්ඩලයෙහි මිලදී ගැණුම් වැඩිවීමක් පෙන්නුම් කළද එම මිලදී ගැණුම් මුළු නිෂ්පාදනයෙන් සියයට 2 කට වඩා අඩුවිය. මේ අතර වී වල සහතික මිල 1991 වර්ෂයේ මාර්තු මසදී බුසලකට රුපියල් 110 සිට බුසලකට රුපියල් 136 දක්වා වැඩි කරන ලදී.

රටෙහි මෙතෙක් පැවැති ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කරමින් 1991 දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 66,440 ක් දක්වා සියයට 16 කින් වැඩි විය. කන්තලේ, සෙවනගල සහ පැල්වත්ත කර්මාන්ත ශාලා මගින් කලින් වර්ෂයේ නිෂ්පාදනයට දෙන ලද දායකත්වය 1991 වර්ෂය තුළදී

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

ද වැඩි විය. කන්තලේ කර්මාන්ත ශාලාවෙහි මෙට්‍රික් ටොන් 2,544 දක්වා සියයට 8 කින් ද, සෙවනගල කර්මාන්ත ශාලාවෙහි මෙට්‍රික් ටොන් 10,554 දක්වා සියයට 9 කින් ද සීනි නිෂ්පාදනය වැඩි විය. මේ අතර පැල්වත්ත කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය සැළකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 43,968 ක් දක්වා සියයට 33 කින් වැඩි විය. 1990 වර්ෂයේ රටෙහි මුළු සීනි නිෂ්පාදනයෙන් සියයට 58 ක දායකත්වයක් දැක් වූ පැල්වත්ත කර්මාන්ත ශාලාව 1991 වර්ෂයේදී එම දායකත්වය සියයට 66 දක්වා වැඩි කරන ලදී. මේ අතර, පසුගිය වර්ෂයෙහි සීනි නිෂ්පාදනයෙහි සියයට 15 ක අඩුවීමක් පෙන්නුම් කළ හිඟුරාන කම්හලෙහි නිෂ්පාදනය 1991 දී තවදුරටත් මෙට්‍රික් ටොන් 9,374 ක් දක්වා සියයට 23 කින් අඩු විය.

කෘෂිකාර්මික සංවර්ධන සහ පර්යේෂණ අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද දත්තයන්ට අනුව 1991 වර්ෂයේදී අතිරේක ආහාර භෝග නිෂ්පාදනය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්විය. වර්ෂය තුළ තල සහ ලොකු ළූණු නිෂ්පාදනයෙහි වැඩි වීමක් පෙන්නුම් කළ අතර, මිරිස්, රතුළූණු සහ අර්තාපල් වැනි ඉහළ වටිනාකමක් සහිත අතිරේක ආහාර භෝගයන්හි නිෂ්පාදනයෙහි අඩු වීමක් වාර්තා විය. 1991 දී සුළු අපනයන භෝග අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළද එම අංශයෙහි ක්‍රියාකාරිත්වය පසුගිය වර්ෂයට වඩා යහපත් විය. ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසී යන භෝගයන්හි අපනයන ධාරිතාවෙහි පෙන්නුම් කළ සැළකිය යුතු වර්ධනය තුළින් පෙන්නුම් කරනුයේ 1991 දී එම භෝග නිෂ්පාදන ප්‍රමාණයෙහි ඇති වූ සැළකිය යුතු වර්ධනයයි. ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසී අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 58 ක් සහ සියයට 80 ක් විය. කුරුඳු අපනයන ප්‍රමාණයද මෙට්‍රික් ටොන් 7,889 ක් හෙවත් සියයට 21 ක සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අතර කෝපි අපනයන ප්‍රමාණයද 1990 දී මෙට්‍රික් ටොන් 1,244 සිට 1991 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 2,660 දක්වා දෙගුණයක වැඩි වීමක් වාර්තා කරන ලදී. 1991 දී කරාබු නැටි, කරදමුංගු, කොකෝවා සහ කජු අපනයනයන් සැළකිය යුතු නිෂ්පාදන අඩු වීමක් පිළිබිඹු කරමින් අඩු විය. කරාබු නැටි, කොකෝවා සහ කරදමුංගු අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 55 ක්, සියයට 55 ක් සහ සියයට 35 ක් වශයෙන් අඩු වීම් වාර්තා කරන ලදී.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවලට අනුව 1991 දී මුළු මාළු නිෂ්පාදනයේ පසුගිය වර්ෂයේ වාර්තා කරන ලද සියයට 14 ක අඩු වීම හා සසඳන කළ මෙට්‍රික් ටොන් 198,063 හෙවත් සියයට 12 ක වැඩිවීමක් පිළිබිඹු කරන ලදී. මෙම ඇස්තමේන්තුවලට අනුව වෙරළාසන්න ධීවර උප අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 19 කින් ද, වෙරළින් ඈත සහ ගැඹුරු මුහුදු අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 29 කින් ද 1991 දී වැඩි විය. මේ අතර මිරිදිය ධීවර උප අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 24 කින් අඩු විය. රටෙහි මුළු මත්ස්‍ය නිෂ්පාදනයට මුළුමනින්ම වාගේ දායක වූයේ පෞද්ගලික අංශයයි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව කිරි නිෂ්පාදනය පිළිබඳ දත්තයන් ලබා ගත හැක්කේ දිස්ත්‍රික්ක 20 කට අදාළව පමණි. තාවකාලික ඇස්තමේන්තුවලට අනුව කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව් සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක හැරුණු විට 1991 දී මුළු කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 281 ක් දක්වා සියයට 3 කින් වැඩි වූ අතර මුළු බිත්තර නිෂ්පාදනයද පසුගිය වර්ෂය හා සසඳන කළ දශ ලක්ෂ 844 ක් දක්වා සියයට 6 ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

මෑත කාලයේ සැළකිය යුතු ක්‍රියාශීලිත්වයක් පෙන්නුම් කළ කර්මාන්ත අංශය 1991 වර්ෂයේදී ද තරමක අඩු වේගයකින් වුවද වර්ධනයක් පවත්වා ගන්නා ලදී. 1990 දී මූර්ත වශයෙන් සියයට 14 කින් වර්ධනය වූ කාර්මික නිෂ්පාදනයේ වටිනාකම 1991 දී ද තවදුරටත් සියයට 10 කින් වැඩි විය. කෙසේ වෙතත්, 1991 කාර්මික නිෂ්පාදනයේ වර්ධනය මුළුමනින්ම පාහේ පෞද්ගලික අංශයේ දායකත්වයෙන් සිදු විය. පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුම වර්ෂය තුළ සියයට 14 කින් වැඩි වූ අතර රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 8 කින් අඩු විය.

1991 දී වැඩි වීම් වාර්තා කරන ලද කාර්මික උප අංශයන් වූයේ මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 34) රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදිත (සියයට 16) කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (සියයට 15) සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 14) සහ ආහාර පාන වර්ග සහ දුම්කොළ

(සියයට 8) වූ අතර අඩුවීම් වාර්තා කරන ලද්දේ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 3) සහ දැව හා දැව නිෂ්පාදිත (සියයට 2) යන උප අංශ වලිනි. කාර්මික අංශයන් ගණනාවකම නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා ප්‍රමුඛ දායකත්වයක් පුද්ගලික අංශය ලබාදුන් අතර මේ සඳහා රාජ්‍ය අංශයෙහි දායකත්වයෙහි අඩු වීමක් වාර්තා විය.

රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම 1990 වර්ෂයේ සියයට 14 ක වර්ධනය හා සාපේක්ෂව 1991 දී මූර්ත වශයෙන් සියයට 8 කින් අඩු විය. රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනයෙහි මෙම තියුණු අඩුවීමට විශාල ලෙස හේතු වූයේ රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 77 කට දායක වන ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ජාතික පේෂ කර්ම සංස්ථාව යන සංස්ථාවන්හී නිෂ්පාදනයේ සිදු වූ සැළකිය යුතු අඩු වීමයි. ඛනිජ තෙල් හැරුණු කොට, රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 7 ක අඩුවීමක් වාර්තා කළේය. ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1991 වර්ෂයේ පළමු කාර්තුවෙහි සති 4 ක පමණ කාලයක් පිරිපහදුව වසා තැබීම වූ අතර ජාතික පේෂකර්ම සංස්ථාවේ නිෂ්පාදනය සියයට 30 කින් අඩු වීමට මූලික වශයෙන් හේතු වූයේ තුල්හිරිය සහ පූගොඩ පෙහෙකම්හල්වල අයිතිය පුද්ගලික අංශයට මාරු වීමය.

නිෂ්පාදන අංශයෙන් සළකා බලන කල, රාජ්‍ය අංශයේ කර්මාන්ත ව්‍යවසායයන් ගණනාවක් 1991 වර්ෂය තුළදී දුර්වල ක්‍රියාකරිත්වයක් පෙන්වීය. අඩු නිමැවුම් වාර්තා කරන ලද ව්‍යවසායයන් වූයේ: ලංකා සම්භාණ්ඩ (සියයට 65): ලංකා ලෝහ (සියයට 48): රාජ්‍ය දැව (සියයට 44): තෙල් හා මේද (සියයට 32): ජාතික පේෂකර්ම (සියයට 30): ජාතික ලුණු (සියයට 17): ශ්‍රී ලංකා සීනි (සියයට 15): ලංකා ඛනිජ වැලි (සියයට 12): රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයට 10): ලංකා ඛනිජ තෙල් (සියයට 9) සහ ලංකා සෙරමික් (සියයට 9) ය. වර්ෂය තුළ වැඩි නිමැවුම් වාර්තා කරන ලද්දේ ස්කාගාර සමාගම (සියයට 57), ලංකා වානේ (සියයට 39), ජාතික කඩදාසි (සියයට 16), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 9) සහ රාජ්‍ය පතල් කැනීම් සහ ඛනිජ සංවර්ධන (සියයට 6) යන ව්‍යවසායයන්ය.

1991 වර්ෂයේ රාජ්‍ය අංශයේ කර්මාන්ත ව්‍යවසායයන් සඳහා කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම, කලින් වර්ෂය හා සසඳන කල සියයට 62 ක අඩු වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 42 ක් විය. මෙම මුළු අරමුදල ප්‍රාග්ධන සංක්‍රාම ලෙස ජාතික පේෂකර්ම සංස්ථාවට ලබා දෙන ලදී. "ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානය" ලෙස ක්‍රියාත්මක වන මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) 1991 වර්ෂය තුළ ම.කො.ආ.කො. තත්ත්වයන් යටතේ ව්‍යාපෘතීන් 74 ක් අනුමත කොට ඇති අතර 1991 වර්ෂය අවසාන වන විට අනුමැතිය ලත් මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 411 ක් විය. මින් ව්‍යාපෘතීන් 246 වෙනුවෙන් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ම.කො.ආ.කො. සමග ගිවිසුම් ඇති කර ගන්නා ලදී. 1991 අවසානය වන විට ව්‍යවසායයන් 153 ක් වාණිජමය නිෂ්පාදන කටයුතු ආරම්භ කොට තිබුණි. මින් 72 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළද, 28 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළද, 2 ක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සහ 51 ක් මෙම කලාපයන්ගෙන් පිටතද විය. වර්ෂය තුළ ම.කො.ආ.කො. ව්‍යවසායයන්හි සේවානියුක්තිය සියයට 20 කින් වැඩි වූ අතර වර්ෂය අවසානය වන විට මෙම ව්‍යවසායයන්හි මුළු සේවා නියුක්තිය පුද්ගලයන් 85,457 ක් විය. මින් 56,825 ක් තොහොත් සියයට 66 ක් රෙදිපිළි, ඇගළුම් සහ සම්භාණ්ඩ අංශයෙහි නියුක්තව සිටියහ.

1991 වර්ෂය තුළ ආර්ථික පසුබිමෙහි දක්නට ලැබුණ වඩාත් හිතකර ලක්ෂණය වූයේ මිල මට්ටම් වර්ධන අනුපාතයෙහි සැළකිය යුතු අඩු වීමයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි 1990 වර්ෂයේ සියයට 21.5 ක වැඩිවීම හා සසඳා බලන කල 1991 දී වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 12.2 ක් විය. වාර්ෂික පදනමක් මත සළකන කළ මෙම වර්ධනය (1990 දෙසැම්බර් සිට 1991 දෙසැම්බර්) සියයට 9.0 ක් විය. මිල මට්ටම මත වූ පීඩනයේ අඩුවීම ප්‍රාථමික වෙළෙඳ පොළ මිල මට්ටම් නිරූපනය කරන තොග මිල දර්ශකයේ වෙනස් වීම තුළින් ද දක්නට ලැබුණි. 1990 දී සියයට 22.2 ක වැඩි වීම හා සසඳා බලන කල 1991 දී තොග මිල දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 9.2 ක් විය.

1991 වර්ෂය තුළදී මිල පීඩනය අඩු කිරීමෙහිලා සාධක කිහිපයක් දායක විය. මේ අතර

පාන් සහ කිරිගු පිටිවල පාලන මිල 1991 ජනවාරි මසදී අඩු වීම, සමහර කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍යයන්වල ඉහළ ගිය සැපයුම් තත්ත්වය, සීනි සහ කිරිගු පිටි වැනි මූලික ආහාර ද්‍රව්‍යයන් සඳහා ස්ථාවරව පැවති ජාත්‍යන්තර මිල සහ වර්ෂය තුළ විනිමය අනුපාතිකය මධ්‍යස්ථ ලෙස පහත වැටීමත් වේ.

1991 වසර තුළදී මිල පීඩනයෙහි ලිහිල්වීම පුළුල් ක්ෂේත්‍රයක් පුරා දක්නට ලැබුණි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් සියයට 61.9 ක් සඳහා බර තබනලද ආහාර සඳහා වූ උප දර්ශකය 1990 සියයට 23.3 ක වැඩිවීම හා සසඳා බලන කල 1991 දී වැඩි වූයේ සියයට 11.1 කින් පමණි. පාන් සහ කිරිගු පිටිවල පාලන මිලෙහි වූ අඩු වීම මිල ගණන් වල මධ්‍යස්ථ වර්ධනයක් සඳහා සෘජු ලෙස බලපෑවා පමණක් නොව වක්‍ර ලෙස ආදේශන ප්‍රතිවිපාකය තුළින් මිල පහත මට්ටමක පවත්වා ගැනීමට ද දායක විය. යහපත් කාලගුණ තත්ත්වයන් පැවතීම නිසා එළවළු සහ ධාන්‍ය වර්ග වැනි බොහොමයක් කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍යවල සැපයුම සතුටුදායක ලෙස පවත්වා ගැනීමට හැකි වූ අතර එමගින් කලින් වර්ෂයට වඩා 1991 දී මෙම වෙළෙඳ ද්‍රව්‍යයන්ගේ මිලෙහි ඉතා සුළු වර්ධනයකට ද දායක විය. මේ අතර, ඇඳුම් සඳහා වූ උප දර්ශකය පසුගිය වර්ෂයේ වූ සියයට 24.5 ක ඉතා ඉහළ වැඩිවීම හා සසඳන කළ වාර්ෂික සාමාන්‍ය පදනම යටතේ 1991 දී වැඩි වූයේ සියයට 11.5 කිනි. ඉන්ධන සහ ආලෝකය සඳහා වූ උප දර්ශකය 1991 වර්ෂයේදී සියයට 16.5 ක ඉහළම වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර මෙයට හේතු වූයේ 1990 දී ඉහළ නංවන ලද භූමිතෙල් මිලෙහි වූ මුලු බලපෑම 1991 වසර තුළ දැනීමය. එසේම විවිධ අයිතමයන් සඳහා වූ උප දර්ශකය 1990 වසරේ සියයට 18.7 ක වර්ධනය හා සසඳන කල මෙම වර්ෂයේ සියයට 12.4 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

ප්‍රාථමික වෙළෙඳ පොළ මට්ටමිහි මිල වෙනස් වීම් මනිනු ලබන තොග මිල දර්ශකය මගින්ද 1991 වර්ෂය තුළදී ආර්ථිකයේ අඩු වූ මිල පීඩනය පෙන්නුම් කරයි. මෙම දර්ශකය මගින් 1990 දී නිරීක්ෂණය කරන ලද සියයට 22.2 ක වැඩිවීමට සාපේක්ෂව වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 9.2 ක් ලෙස වාර්තා විය. වාර්ෂික පදනමක් මතද (1990 දෙසැම්බර් සිට 1991 දෙසැම්බර්) මෙම දර්ශකය පෙන්නුම් කරන ලද්දේ 1990 සියයට 17 ක වැඩිවීමට සාපේක්ෂව සියයට 8.1 ක වැඩිවීමක් පමණි. වර්ෂය තුළ තොග මිල දර්ශකයෙහි වර්ධන අනුපාතය අඩු කිරීමෙහිලා ආහාර මිල ගණන් හි මධ්‍යස්ථ වර්ධනය සැළකිය යුතු ලෙස දායක විය.

සාපේක්ෂ ලෙස මිලෙහි ඉහළ වර්ධනයක් වාර්තා වූ උප කොටස් අතර ඛනිජ තෙල් නිෂ්පාදිත, රසායනික සහ රසායනික නිෂ්පාදිත, මත්පැන් වර්ග සහ ප්‍රවාහන උපකරණ යන උප දර්ශකයන් ඇතුළත් වේ. ආංශික වර්ගීකරණයක් කිරීමේදී පෙනී යන්නේ ගෘහස්ථ අංශයන් සඳහා වූ උප දර්ශකය, අනෙකුත් උප අංශයන්ට වඩා ඉතාමත් කැපී පෙනෙන ලෙස වැඩි වූ බවයි. ගෘහස්ථ අංශය සඳහා වූ වාර්ෂික සාමාන්‍ය දර්ශකය 1991 දී සියයට 11 කින් වැඩි වූ අතර ආනයන සහ අපනයන අංශයන් පිළිවෙලින් සියයට 6 කින් සහ සියයට 7.5 කින් වැඩිවිය.

1991 රාජ්‍ය අංශයේ නාමික වැටුප් වැඩිවීම 1990 වැඩිවීම හා සමාන වන අතර පුද්ගලික අංශයේ නාමික වැටුප් වැඩිවීම 1990 වර්ෂයේ අනුපාතයට වඩා තරමක් වැඩිවිය. රජයේ සේවකයන්ගේ නාමික වැටුප් අනුපාතික දර්ශකයෙන් මනිනු ලැබූ, සාමාන්‍ය නාමික වැටුප් සියයට 12.1 කින් වැඩි වූ අතර එය 1990 ට වඩා තරමක අඩු වර්ධනයකි. පඩිපාලක සභා මගින් ආවරණය වන වෙළෙඳ කටයුතු ඇතුළත් සංවිධිත පුද්ගලික අංශයේ මුළු නාමික වැටුප් 1990 සියයට 16.9 ක වැඩිවීමට සාපේක්ෂව 1991 දී සියයට 14.4 කින් වැඩි විය. රජයේ සහ පෞද්ගලික අංශයේ නාමික වැටුප් 1990 ට වඩා අඩු අනුපාතිකයකින් වැඩි වුවද, රජයේ සේවකයන්ගේ මූර්ත වැටුප් බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. එහෙත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් වර්ෂය තුළ ආර්ථිකයේ පැවැති මධ්‍යස්ථ උද්ධමනකාරි තත්ත්වය හේතුවෙන් සියයට 2.0 ක් පමණ සුළු වැඩිවීමක් පෙන්නුම් කෙරිණ. එහෙත් මෙම දෙඅංශයේම මූර්ත වැටුප් 1990 දී පහත වැටුණි.

පෙර වසරේ දක්නට ලැබුණු ප්‍රවනතාවන් අනුව යමින් 1991 දී පුද්ගලික අංශයේ සේවා නියුක්තිය තවදුරටත් වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පහත වැටිණි. තාවකාලික ඇස්තමේන්තු අනුව, රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය 1991 අවසානය වන විට 1,307,000

දක්වා සියයට 3.3 කින් අඩු විය. රාජ්‍ය අංශය තුළ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය, මධ්‍යම ආණ්ඩුව මෙන්ම ප්‍රාදේශීය සභා හා පළාත් සභා උප අංශයන්ද ඇතුළුව පෙර වසරට වඩා සියයට 0.6 ක ආන්තික වැඩිවීමක් වාර්තා කරමින් 1991 දී 652,600 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. මෙම වර්ධනය සම්පූර්ණයෙන්ම පිළිබිඹු වූයේ, ආරක්ෂක අංශයේ සේවයේ නියුතු පුද්ගලයන්ද ඇතුළුව, සේවා කාණ්ඩයේ වූ සේවා නියුක්තියෙහිය. සේවා කාණ්ඩයේ සේවක සංඛ්‍යාව ඉවත් කළ පසු රාජ්‍ය අංශයේ ඉතිරි කාණ්ඩවල සේවා නියුක්තිය සියයට 6.8 කින් අඩු විය. 1990 ඔක්තෝබර් මසදී ක්‍රියාත්මක කරන ලද කලින් විශ්‍රාම ගැනීම සඳහා වූ දිරිගැන්වීමේ ක්‍රමය, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අඩුවීමට විශාල වශයෙන් බලපෑ කරුණක් විය. මේ අතර රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජයට පවරා ගත් ව්‍යාපාර ආයතන හා රාජ්‍ය බැංකු ඇතුළු අර්ධ රාජ්‍ය උප අංශයේ සමස්ත සේවා නියුක්තිය සියයට 6.9 කින් අඩු වූ බවට ඇස්තමේන්තු කර ඇත.

පුද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික ක්‍රමික දත්ත පෙළක් නොමැති වීම නිසා එම අංශයේ සේවා නියුක්තියේ වෙනස්කම් අගැයීම සඳහා විවිධ මිනුම් දඬු භාවිතා කරන ලදී. සේවක අර්ථ සාධක අරමුදලේ ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව 1990 දී 1,188,757 සිට 1991 දී 1,266,031 දක්වා සියයට 6.5 කින් වැඩි විය. මේ අතර පුද්ගලික භාරකාර අරමුදල් වල මුළු සේවක සංඛ්‍යාව 1991 දී පෙර වසරට වඩා සියයට 25 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. එමෙන්ම මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන්ගේ සේවා නියුක්තිය මෙම වසර තුළදී සියයට 19 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙම හේතුන් මෙන්ම, දුගී බව නැති කිරීමේ ව්‍යාපෘතිය යටතේ විශාල ලෙස වැඩිවූ ස්වයං රැකියා අවස්ථා සහ ආයතනික ණය ව්‍යාපෘතීන් තුළින් පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සැළකිය යුතු ලෙස ප්‍රසාරණය විය.

අපනයනයන්හි දක්නට ලැබුණු මන්දගාමී වර්ධනයත්, ආනයනයන්හි සිදු වූ විශාල ඉහළ නැගීමත් හේතු කොටගෙන වෙළෙඳ ගිණුමේ හිඟය 1991 දී තවදුරටත් පුළුල් විය. මෙය පසුගිය වසර තුන තුළ දී වෙළෙඳ ගිණුම අඛණ්ඩව පහත වැටීමෙන් වාර්තා කළ ප්‍රගතියට ප්‍රතිවිරුද්ධ වූ ප්‍රවනතාවයකි. 1990 දී වාර්තා වූ සියයට 20 ක කැපී පෙනෙන වර්ධනය හා සසඳන කල, වෙළඳ භාණ්ඩ අපනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 1,491 (රුපියල් දශ ලක්ෂ 84,378) ක් දක්වා සියයට 2 කින් වැඩි විය. මේ අතර 1990 දක්නට ලැබුන සියයට 14 ක වර්ධනය හා සසඳන කල 1991 දී ආනයන වියදම සියයට 13 කින් විගැහි දශ ලක්ෂ 2,237 (රුපියල් දශ ලක්ෂ 126,643) ක් දක්වා වැඩි විය. මේ අනුව වෙළෙඳ ගිණුමේ හිඟය 1990 දී විගැහි දශ ලක්ෂ 519 (රුපියල් දශ ලක්ෂ 28,248) සිට 1991 විගැහි දශ ලක්ෂ 747 (රුපියල් දශ ලක්ෂ 42,264) දක්වා ප්‍රසාරණය විය. ඒ හා සමඟම, අපනයන ඉපැයීම්වලට ආනයන වියදම් වල අනුපාතය 1990 දී සියයට 74 සිට 1991 දී සියයට 66 දක්වා පහත වැටිණි. මේ අතර, ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයනයන් හි සමස්ත මිල විචලනයන් අඛණ්ඩව අවාසිදායක තත්ත්වයක පැවතිණි. ඒ අනුව, අපනයන මිළ ගණන් හි වූ ආන්තික වර්ධනයද අභිභවමින් 1991 දී වෙළෙඳ අනුපාතය සියයට 1.9 කින් පිරිහිණි. තේ අපනයන මිළෙහි වූ තියුණු පහත වැටීමත්, ප්‍රවාහන උපකරණ, පොහොර, රෙදිපිළි හා ඇඟළුම් වැනි ප්‍රධාන ආනයන අයිතමයන්ගේ මිළ ගණන් සැළකිය යුතු ලෙස වැඩිවීමත්, වෙළෙඳ අනුපාතයේ පිරිහීමට දායක වූ ප්‍රධාන සාධකයන් විය.

රේගු සංඛ්‍යා අනුව 1991 දී කාර්මික අපනයන හැරුණු කොට බොහෝ අපනයන අංශයන්ගේ, ක්‍රියාකාරීත්වය පහත් මට්ටමක පැවතුණි. වැවිලි භෝගයන්හි සමස්ත අපනයන ආදායම සියයට 12 කින් පහත වැටුණු අතර, ඛනිජ තෙල් නිෂ්පාදන, මැණික්, දියමන්ති හා අනිකුත් ඛනිජ නිෂ්පාදිත අපනයන ද පිළිවෙලින් සියයට 21, සියයට 22, සියයට 23 හා සියයට 60 කින් පහත වැටිණි. කෙසේ වුවද, වසර තුළදී රෙදිපිළි හා ඇඟළුම් අපනයන ඉපැයීම් වල ඉහළ යාමක් වාර්තා වූ අතර අනෙකුත් කාර්මික අපනයන හා සුළු කෘෂිකාර්මික භෝග අපනයන ආදායම් වලද ආන්තික වැඩිවීම් දක්නට ලැබුණි.

රේගු සංඛ්‍යාවන් අනුව තේ අපනයන වටිනාකම ප්‍රධාන වශයෙන් මිළ ගණන් හි තියුණු පහත වැටීම් හේතු කොට ගෙන, 1990 දී විගැහි දශ ලක්ෂ 364 (රුපියල් දශ ලක්ෂ 19,823) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 316 (රුපියල් දශ ලක්ෂ 17,867) දක්වා සියයට 13 කින් පහත

වැටිණි. තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිළ 1990 දී කිලෝ ග්‍රෑමයකට විගැහි 1.69 (කිලෝ ග්‍රෑමයකට රු. 91.78) සිට 1991 දී කිලෝ ග්‍රෑමයකට විගැහි 1.49 (කිලෝ ග්‍රෑමයකට රු. 84.12) දක්වා පහත වැටිණි. තේ මිළ පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලෝක තේ සැපයුම වැඩිවීම, කාර්මික රටවල ආර්ථික අවපාත තත්ත්වයන් නිසා ඉල්ලුම පහළ යාම හා ඊජිප්තුව, ඉරාකය, නැගෙනහිර යුරෝපා රටවල් සහ රුසියාව අඩු වශයෙන් තේ මිළදී ගැනීම වැනි කරුණුය. මේ අතර, තේ නිෂ්පාදනය වැඩි වුවද, තේ අපනයන ප්‍රමාණය 1990 වර්ෂයේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 216 සිට 1991 වර්ෂයේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 212 දක්වා සියයට 2 කින් පහත වැටුණි. තේ සම්බන්ධයෙන් දක්නට ලැබුණු ප්‍රවනතාවය අනුව යමින්, රබර් අපනයන වටිනාකමද අපනයන මිළ හා ප්‍රමාණය යන දෙකෙහිම පහත වැටීම හේතු කොට ගෙන 1990 දී විගැහි දශ ලක්ෂ 57 (රුපියල් දශ ලක්ෂ 3,080) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 47 (රුපියල් දශ ලක්ෂ 2,641) දක්වා සියයට 18 කින් පහත වැටිණි. රබර් අපනයන ප්‍රමාණය 1990 කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 87 සිට 1991 කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 76 දක්වා සියයට 13 කින් පහත වැටුණ අතර, රබර් සඳහා වූ සාමාන්‍ය අපනයන මිළ කිලෝ ග්‍රෑමයට විගැහි 0.65 (කිලෝ ග්‍රෑමයට රු. 35.50) සිට කිලෝ ග්‍රෑමයට විගැහි 0.61 (කිලෝ ග්‍රෑමයට රු. 34.57 ) දක්වා සියයට 6 කින් පහත වැටිණි. කාර්මික රටවල ඇති වූ ආර්ථික අවපාතය මෙන්ම නැගෙනහිර යුරෝපයේ සම්ප්‍රදායික ගැණුම් කරුවන්ගේ මිළදී ගැනීම් අඩු වීම ස්වභාවික රබර් වෙළෙඳ පොළ කෙරෙහි බලපෑ අහිතකර සාධකයන් විය. තේ හා රබර් අපනයන ඉපැයුම් පහත වැටීමේ ගැටළුව තව දුරටත් තිවූ කරමින් පොල් නිෂ්පාදන අපනයන ඉපැයුම් ද, අපනයන ප්‍රමාණය ගෙඩි දශ ලක්ෂ 508 සිට ගෙඩි දශ ලක්ෂ 367 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටීම නිසා 1990 දී විගැහි දශ ලක්ෂ 51 (රුපියල් දශ ලක්ෂ 2,783) සිට 1991 විගැහි දශ ලක්ෂ 46 (රුපියල් දශ ලක්ෂ 2,619) දක්වා සියයට 10 කින් පහත වැටිණි. මේ අතර අපනයන ඉපැයුම් කෙරෙහි පහත වැටුණු අපනයන ප්‍රමාණයේ අයහපත් බලපෑම යම් පමණකට සමනය කරමින් පොල් ගෙඩියක සාමාන්‍ය අපනයන මිළ විගැහි 0.09 දක්වා සියයට 29 කින් ඉහළ ගියේය. ඒ හා සමහම, විශේෂයෙන්ම ගුදිරි කොහු කෙඳි හා බ්‍රිස්ටල් කොහු කෙඳි වලට අදාල වූ ආදායම් අඩු වීම නිසා පොල් අතුරු නිෂ්පාදනයන් ගේ අපනයන ඉපැයුම් වටිනාකම්ද අඩු විය.

1991 දී ප්‍රධාන වැවිලි භෝග අපනයනයන්හි දුර්වල ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුන අතර, සුළු අපනයන භෝගයන්හි අපනයන ආදායමේ ආන්තික වැඩි වීමක් සිදු විය. මෙම අපනයනයන්හි වටිනාකම 1990 දී විගැහි දශ ලක්ෂ 59 (රුපියල් දශ ලක්ෂ 3,199) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 60 (රුපියල් දශ ලක්ෂ 3,409) දක්වා සියයට 2 කින් වැඩි විය. එමෙන්ම සකස් නොකළ දුම්කොළ, ගම්මිරිස්, කෝපි, කජු, පුවක් සහ පළතුරු ආදී අපනයන ඉපැයුම් වලද සැලකිය යුතු වැඩිවීම් දක්නට ලැබුණි.

මෑත වර්ෂවල දක්නට ලැබුන ඉහළ මට්ටමක පැවති විවිධත්වය විදහා දක්වමින්, කාර්මික අපනයන වටිනාකම 1990 දී විගැහි දශ ලක්ෂ 763 (රුපියල් දශ ලක්ෂ 41,510) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 896 (රුපියල් දශ ලක්ෂ 50,736) දක්වා සියයට 17 කින් වැඩිවිය. මෙම වැඩිවීමෙහි විශාල කොටසකට දායක වූයේ විගැහි දශ ලක්ෂ 462 (රුපියල් දශ ලක්ෂ 25,163) සිට විගැහි දශ ලක්ෂ 588 (රුපියල් දශ ලක්ෂ 33,261) දක්වා මෙම දෙවසර තුළදී සියයට 27 කින් වර්ධනය වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන ඉපැයුම්ය. සම් හා රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත හා පාන වර්ග හා දුම්කොළ වැනි අනිකුත් කාර්මික නිෂ්පාදනවල සමුච්චිත වටිනාකම සියයට 10 කින් වැඩි විය. මේ අතර, ඛනිජ තෙල් අපනයන අදායම 1990 විගැහි දශ ලක්ෂ 73 (රුපියල් දශ ලක්ෂ 3,974) සිට 1991 විගැහි දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 3,289) දක්වා සියයට 21 කින් අඩු වූ අතර, දියමන්ති අපනයන ආදායම විගැහි දශ ලක්ෂ 65 (රුපියල් දශ ලක්ෂ 3,684) සිට විගැහි දශ ලක්ෂ 50 (රුපියල් දශ ලක්ෂ 2,807) දක්වා සියයට 23 කින් අඩු විය. ඒ හා සමහම ඛනිජමය අපනයනවලින් ලැබූ ආදායම 1990 දී විගැහි දශ ලක්ෂ 64 (රුපියල් දශ ලක්ෂ 3,484) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 45 (රුපියල් දශ ලක්ෂ 2,562) දක්වා සියයට 30 ක අඩුවීමක් වාර්තා කරන ලදී. මෙම අඩුවීම බොහෝ දුරට පිළිබිඹු වූයේ විගැහි දශ ලක්ෂ 54 (රුපියල් දශ ලක්ෂ 2,933) සිට විගැහි දශ ලක්ෂ 42 (රුපියල් දශ ලක්ෂ 2,358) දක්වා සියයට 22 කින් අඩු වූ මැණික් අපනයනයන් තුලිනි.

මෙම වර්ධනයත් සමඟ අපනයන සංයුතිය 1991 දී යම් වෙනස්වීම්වලට භාජනය විය. සමස්ත අපනයන්හි කාර්මික භාණ්ඩ අපනයන කාණ්ඩයේ දායකත්වය 1990 දී සියයට 52 සිට 1991 දී සියයට 60 දක්වා ඉහළ නැගුණ අතර එය තවදුරටත් ප්‍රධාන අපනයන කාණ්ඩය වශයෙන් ස්ථාපිත තත්ත්වයක පැවතුණි. මෑත අතීතයේදී අඛණ්ඩව පහළ වැටුණු වැවිලි කෘෂිකාර්මික භෝගයන්හි අපනයන සංයුතියෙහි දායකත්වය 1990 සියයට 36 සිට 1991 දී සියයට 31 දක්වා තවදුරටත් පහත වැටිණි. මේ අතර, ඛනිජමය අපනයනයන්හි කොටසද මෙම දෙවසර තුළදී සියයට 4 සිට සියයට 3 දක්වා පහත වැටිණි. තනි අයිතමයක් ලෙස ගත් කළ, 1986 දී අපනයන වටිනාකම අනුව විශාලම අයිතමය බවට පත් වූ රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයන්හි දායකත්වය 1990 දී සියයට 32 සිට 1991 දී සියයට 39 දක්වා වර්ධනය වෙමින් එම අංශයේ ප්‍රමුඛත්වය තවදුරටත් පවත්වා ගනු ලැබීය.

ගලපන ලද රේගු සංඛ්‍යාවත් අනුව, ආනයන සඳහා වූ මුළු වියදම 1990 විගැහි දශ ලක්ෂ 1,980 (රුපියල් දශ ලක්ෂ 107,729) හා සසඳන කල සියයට 13 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1991 දී විගැහි දශ ලක්ෂ 2,237 (රුපියල් දශ ලක්ෂ 126,643) ක් විය. මෙම වැඩිවීම, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ යන ආනයන කාණ්ඩ තුනෙහිම පිළිබිඹු විය. පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1990 දී විගැහි දශ ලක්ෂ 522 (රුපියල් දශ ලක්ෂ 28,420) සිට 1991 විගැහි දශ ලක්ෂ 572 (රුපියල් දශ ලක්ෂ 32,357) දක්වා සියයට 10 කින් ඉහළ නැගුණි. මෙම වැඩිවීම, සියයට 17 ක වර්ධනයක් වාර්තා කළ "අනිකුත් පාරිභෝගික භාණ්ඩ" වියදමෙහි විශාල වශයෙන් පිළිබිඹු විය. කෙසේ වුවද, 1991 පාරිභෝගික භාණ්ඩ ආනයනයේ වූ කැපී පෙනෙන ලක්ෂණය වූයේ සහල්, කිරිඟු පිටි හා සීනි යන ප්‍රධාන ආහාර ද්‍රව්‍ය තුනෙහි ආනයන වියදම අඩු වීමයි. ප්‍රධාන වශයෙන් මෙම දෙවර්ෂය තුළ අපනයන ධාරිතාවය මෙට්‍රික් ටොන් 39,000 කින් අඩු වීම කරණ කොට ගෙන සහල් ආනයන වටිනාකම 1990 විගැහි දශ ලක්ෂ 32 (රුපියල් දශ ලක්ෂ 1,758) සිට 1991 විගැහි දශ ලක්ෂ 28 (රුපියල් දශ ලක්ෂ 1,589) දක්වා සියයට 13 ක අඩු වීමක් පෙන්විය. දේශීය වශයෙන් පිටි නිෂ්පාදනය කිරීම සඳහා අන්තර් භාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද තිරිඟු ඇට ආනයනය වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1991 දී කිරිඟු පිටි ආනයන වටිනාකම තියුණු ලෙස පහත වැටිණි. සීනි ආනයන ධාරිතාව මෙට්‍රික් ටොන් 53,108 කින් ඉහළ ගියද, අඩු ජාත්‍යන්තර මිළ ගණන් හේතු කොට ගෙන මෙම දෙවසර තුළදී සීනි ආනයන වියදම විගැහි දශ ලක්ෂ 95 (රුපියල් දශ ලක්ෂ 5,173) සිට විගැහි දශ ලක්ෂ 91 (රුපියල් දශ ලක්ෂ 5,139) දක්වා සියයට 5 කින් පහත වැටිණි. ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්හි ආනයන වියදම පහළ ගිය තත්ත්වයක් තුළ පාරිභෝගික භාණ්ඩ සඳහා වැඩි වූ ආනයන වියදම විශාල වශයෙන් පිළිබිඹු වූයේ කිරි, කිරි නිෂ්පාදන සහ අනිකුත් ආහාර ආනයනයන්හිය. කිරි හා කිරි නිෂ්පාදන සඳහා වූ වියදම 1990 දී විගැහි දශ ලක්ෂ 44 (රුපියල් දශ ලක්ෂ 2,367) සිට 1991 විගැහි දශ ලක්ෂ 49 (රුපියල් දශ ලක්ෂ 2,796) දක්වා සියයට 14 කින් වැඩි වූ අතර, "අනිකුත් ආහාර" සඳහා වූ වියදම විගැහි දශ ලක්ෂ 59 (රුපියල් දශ ලක්ෂ 3,200) සිට විගැහි දශ ලක්ෂ 91 (රුපියල් දශ ලක්ෂ 5,135) දක්වා සියයට 54 කින් මෙම දෙවසර තුළ වැඩි විය.

අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන වියදම පෙර වසරට වඩා සියයට 11 ක වර්ධනයක් පෙන්වමින් විගැහි දශ ලක්ෂ 1,135 (රුපියල් දශ ලක්ෂ 64,265) ක් විය. ප්‍රධාන වැඩිවීම් වාර්තා වූයේ, 1990 දී විගැහි දශ ලක්ෂ 247 (රුපියල් දශ ලක්ෂ 13,454) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 364 (රුපියල් දශ ලක්ෂ 20,611) දක්වා සියයට 47 කින් වර්ධනය වූ රෙදිපිළි හා ඇඟළුම් වල සහ එම කාලපරිච්ඡේදය තුළම විගැහි දශ ලක්ෂ 302 (රුපියල් දශ ලක්ෂ 16,428) සිට විගැහි දශ ලක්ෂ 378 (රුපියල් දශ ලක්ෂ 21,391) දක්වා සියයට 29 කින් වැඩි වූ අනිකුත් අන්තර් භාණ්ඩයන්හි ය. ඛනිජ තෙල්, පොහොර හා රසායනික ද්‍රව්‍ය සඳහා වූ ආනයන වියදම 1990 පිළිවෙලින්, සියයට 46 කින්, සියයට 43 කින් හා සියයට 31 කින් වැඩි වූ නමුදු 1991 දී එම වියදම් පිළිවෙලින්, සියයට 14 කින්, සියයට 21 කින් හා සියයට 26 කින් අඩු විය.

මේ අතර ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1990 දී විගැහි දශ ලක්ෂ 430 (රුපියල් දශ ලක්ෂ 23,412) සිට 1991 විගැහි දශ ලක්ෂ 526 (රුපියල් දශ ලක්ෂ 29,792) දක්වා සියයට 22 කින් වැඩිවිණි. මෙය ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ මෙම දෙවසර තුළ විගැහි දශ

ලක්ෂ 83 (රුපියල් දශ ලක්ෂ 4,537) සිට විගැහි දශ ලක්ෂ 134 (රුපියල් දශ ලක්ෂ 7,607) දක්වා සියයට 61 කින් වර්ධනය වූ ප්‍රවාහන උපකරණ වියදමෙහි සහ විගැහි දශ ලක්ෂ 182 (රුපියල් දශ ලක්ෂ 9,885) සිට විගැහි දශ ලක්ෂ 210 (රුපියල් දශ ලක්ෂ 11,881) දක්වා සියයට 16 කින් වර්ධනය වූ යන්ත්‍රෝපකරණ වියදමෙහිය.

1991 දී ආනයන සංයුතිය වෙනස් වූයේ සුළු වශයෙනි. මෙම දෙවසර තුළදී ආනයන සංයුතියෙහි ආයෝජන භාණ්ඩ සඳහා වූ කොටස සියයට 22 සිට සියයට 24 දක්වා වැඩි වූ අතර, අන්තර් භාණ්ඩ සඳහා වූ කොටස සියයට 52 සිට සියයට 51 දක්වා අඩු විය. මේ අතර, පෙර වසරේදී මෙන්ම පාරිභෝගික භාණ්ඩ සඳහා වූ කොටස සියයට 26 ක් ව පැවතිණි.

1991 දී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන ක්‍රියාකාරිත්වය යහපත් සහ අයහපත් ලක්ෂණවලින් මිශ්‍ර වූවකි. වෙළෙඳ හා සේවා ගිණුම්වල හිඟයක් පුළුල් වෙමින් පැවතියද, සංක්‍රාම සහ ප්‍රාග්ධන ගිණුම් යටතේ වෙළඳ සහ සේවා ගිණුම්හි හිඟයන් පියවීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි සම්පත් ප්‍රමාණයක් ගලා ඒමක් දක්නට ලැබිණි. මේ අනුව 1990 දී ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයේ වාර්තා කළ විගැහි දශ ලක්ෂ 133 ක අතිරික්තය අනුව යමින්, මේ වසරේ ගෙවුම් තුලනයේ විගැහි දශ ලක්ෂ 150 ක අතිරික්තයක් දක්නට ලැබිණි. ඒ අනුව, රටේ දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1990 වසර අවසානයේ විගැහි දශ ලක්ෂ 602 සිට 1991 වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 809 දක්වා ඉහළ නැගිණි.

1991 දී ගෙවුම් තුලනයේ එක් අවාසිදායක තත්ත්වයක් වූයේ, වෙළඳ ගිණුමේ දක්නට ලැබුණු සැළකිය යුතු පිරිහීමයි. මීට සමාන අවාසිදායක තත්ත්වයක් සේවා ගිණුමෙහිද වාර්තා වූයේ මහවැලි සංවර්ධන වැඩපිළිවෙලට අයත් මාදුරු ඔය ව්‍යාපාරයෙහි එක්සත් ජනපද කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවීමට තිබූ විගැහි දශ ලක්ෂ 36 ක (එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 50 ක) මුදලක් පියවීම හේතුවෙනි. තොකඩවා පැවති විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීමේ හේතුවෙන් 1991 වසර තුළදී සේවා ගිණුමේ ලැබීම් සහ ගෙවීම් යන දෙඅංශයේම සැළකිය යුතු වැඩිවීමක් වාර්තා විය. වරාය, ප්‍රවාහනය හා රක්ෂණය, විදේශ සංචාර, ආයෝජන ආදායම් සහ වෙනත් සේවා මෙසේ වැඩිවීම් වාර්තා කළ ශීර්ෂයන් විය. වරාය, ප්‍රවාහනය හා රක්ෂණය ගිණුමේ ලැබීම් හා ගෙවීම් යන දෙඅංශයම වැඩි වූ අතර, ශුද්ධ ලැබීම් ප්‍රමාණය 1990 දී වූ විගැහි දශ ලක්ෂ 10 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 18 දක්වා ඉහළ නැගිණි. විදේශිකයන්ගේ පැමිණීම නිසා, සංචාර ගිණුමේ ලැබීම් සියයට 21 කින් ඉහළ ගියද, විදේශ සංචාර මත ගෙවීම්ද, සියයට 31 කින් ඉහළ නැගිණි. මේ නිසා සංචාර ගිණුමේ ශුද්ධ ලැබීම්වල සියයට 8 ක වැඩිවීමක් වාර්තා විය. අනිත් අතට, ආයෝජන ආදායම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් හි වැඩිවීමක් පෙන්නුම් කළද, ලැබීම්වලට වඩා ගෙවීම් වැඩිවීම හේතුවෙන් ශුද්ධ ගෙවීම් ප්‍රමාණය 1990 දී වූ විගැහි දශ ලක්ෂ 104 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 115 දක්වා ඉහළ නැගිණි. මේ අතර, ඉහත සඳහන් කළ විශේෂ ගෙවීම නිසා, 1990 දී විගැහි දශ ලක්ෂ 5 ක් වූ ශුද්ධ ලැබීම් හා සසඳන කල්හි, "වෙනත් සේවා" ශීර්ෂයේ, 1991 දී දක්නට ලැබුණේ විගැහි දශ ලක්ෂ 9 ක ශුද්ධ ගෙවීමකි. සමස්තයක් ලෙස ගත් කළ, 1990 දී වූ විගැහි දශ ලක්ෂ 72 (රුපියල් දශ ලක්ෂ 3,905) ක හිඟය හා සසඳන කළ, 1991 දී ගෙවුම් තුලනයේ සේවා ගිණුමේ විගැහි දශ ලක්ෂ 78 (රුපියල් දශ ලක්ෂ 4,448) ක හිඟයක් වාර්තා විය.

1990 වසර හා සසඳන විට 1991 වසරේදී සංක්‍රාම ගිණුම තුළින් වැඩි සම්පත් ප්‍රමාණයක් ලැබුණි. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම, සියයට 7 කින් වැඩි වී විගැහි දශ ලක්ෂ 288 ක් විය. මෙවරද, පෞද්ගලික සංක්‍රමයන්හි ප්‍රධාන කොටස, මැද පෙරදිග සේවකයන් විසින් ප්‍රේෂණය කරන ලද මුදලින් සමන්විත විය. ගල්ෆ් යුද්ධය සමයේදී විශාල සේවක සංඛ්‍යාවක් කුවේට් වලින් පෙරළා පැමිණියද, වර්ෂය තුළදී පෞද්ගලික සංක්‍රාමයන්හි වැඩි වීමක් වාර්තා විය. ගල්ෆ් යුද්ධය හා සමග ඇති වූ අවිනිශ්චිත භාවය නිසා, මැද පෙරදිග රටවල රැකියාවන්හි නියුක්ත වූවන්ගේ ඉතුරුම්, එම රටවල්හි බැංකුවල තැන්පත් කිරීම වෙනුවට, ලංකාවට ප්‍රේෂණය කිරීම දක්නට ලැබිණි. 1991 වසරේ දෙවැනි භාගයේදී, ගල්ෆ් යුද්ධය අවසන් වීමත් සමග මැද පෙරදිග බලා පිටත්ව ගිය සේවක සංඛ්‍යාවද වැඩි විය. මේ අතර 1991 දී විගැහි දශ ලක්ෂ 143 ක් වූ නිල සංක්‍රාම, වර්ෂය තුළ වැඩිවීමක් වාර්තා කරන ලදී. සමස්ථයක් වශයෙන් පෞද්ගලික හා නිල

16 JUN 2009
22774
INFORMATION CENTRE



සංක්‍රාමයන්හි මුළු ශුද්ධ ලැබීම්, 1990 දී විගැහි දශ ලක්ෂ 398 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 431 දක්වා ඉහළ නැගුණි.

වෙළෙඳ ගිණුමේ තියුණු පිරිහීමේ බලපෑමත් සේවා ගිණුමේ අසතුටුදායක ක්‍රියාකාරිත්වයත් නිසා ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය 1990 දී වූ විගැහි දශ ලක්ෂ 192 (රුපියල් දශ ලක්ෂ 10,390) සිට 1991 දී විගැහි දශ ලක්ෂ 372 (රුපියල් දශ ලක්ෂ 21,127) දක්වා පුළුල් විය. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ මෙම හිඟය, 1990 දී වූ සියයට 3.2 සිට 1991 දී සියයට 5.6 දක්වා ඉහළ නැගිණි. ජංගම ගිණුම් තත්ත්වයේ මෙම පිරිහීම, 1991 දී ගෙවුම් තුලනයේ දක්නට ලැබුණු එක් අවාසිදායක සංවර්ධනයක් විය.

## 1.3 සංඛ්‍යා සටහන

## ගෙවුම් තුලන සාරාංශය 1988 - 1991

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| | 1988 | 1989 | 1990 (අ) | 1991 (ආ) |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ (ශුද්ධ) | -24,268<br>(-568) | -24,050<br>(-530) | -28,145<br>(-518) | -41,184<br>(-725) |
| සාධක නොවන සේවා (ශුද්ධ) | 382<br>(8) | 129<br>(1) | 2,781<br>(51) | 2,868<br>(51) |
| සාධක සේවා (ශුද්ධ) | -5,266<br>(-122) | -5,738<br>(-124) | -6,685<br>(-123) | -7,316<br>(-129) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 10,187<br>(238) | 11,840<br>(258) | 14,518<br>(268) | 16,334<br>(288) |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 6,588<br>(154) | 6,751<br>(147) | 7,142<br>(130) | 8,170<br>(143) |
| ජංගම ගිණුමේ ශේෂය | -12,377<br>(-290) | -11,069<br>(-248) | -10,390<br>(-192) | -21,127<br>(-372) |
| සමස්ත ශේෂය | -3,339<br>(-64) | -1,905<br>(-67) | 7,196<br>(133) | 9,969<br>(150) |
| **ප්‍රධාන දර්ශක සමහරක්** | | | | |
| වෙළෙඳ අනුපාතය (1985 = 100) | 93.0 | 91.4 | 87.4 | 85.7 |
| ශුද්ධ බනිජතෙල් ආනයන | 5,574<br>(130) | 6,134<br>(133) | 10,393<br>(191) | 9,598<br>(170) |
| ජංගම ගිණුමේ හිඟය දෑ දේෑ නිෑ යේ ප්‍රතිශතයක් වශයෙන් | 5.6 | 4.4 | 3.2 | 5.6 |
| දළ ජාත්‍යන්තර සංචිත | 19,025<br>(428) | 23,390<br>(447) | 34,472<br>(602) | 49,223<br>(809) |
| ජාත්‍යන්තර සංචිත වලින් කළ හැකි ආනයන මාස ගණන | 3.1 | 3.1 | 3.7 | 4.4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ජංගම ගිණුමේ අවාසිදායක සංවර්ධනයන්ට ප්‍රතිවිරුද්ධව, ප්‍රාග්ධන ගිණුමේ වාසිදායක නැඹුරුවක් දැකිය හැකි විය. ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ගිණුමේ, 1990 දී වූ විගැහි දශ ලක්ෂ 344 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 475 දක්වා සියයට 38 ක වැඩිවීමක් වාර්තා විය. මෙම වැඩිවීමේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 1990 දී විගැහි දශ ලක්ෂ 31 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 74 දක්වා පෞද්ගලික ආයෝජනයන්හි ඉතා සැළකිය යුතු ඉහළ නැගීමයි. මෙම වැඩිවීම විදේශ සෘජු ආයෝජනයන් සහ කොළඹ කොටස් වෙළෙඳ පොළ තුළින් ආ විදේශ ආයෝජනයන් යන දෙඅංශයෙහිම පිළිබිඹු විය. 1990 දී මෙන්ම පෞද්ගලික ණය ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ශුද්ධ ගෙවීමක් පෙන් වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් එයාර් ලංකා සමාගම විසින් කරන ලද අහස් යාතා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ කෙරුණු ප්‍රගති සහ අත්තිකාරම් ගෙවීම් ද ඇතුළත්

විය. මේ අතර පෞද්ගලික අංශය මගින් කෙටි කාලීන ණයෙහි ශුද්ධ උපයෝගීකරණය 1990 සහ 1991 කාලය අතර, විගැහි දශ ලක්ෂ 48 සිට විගැහි දශ ලක්ෂ 34 දක්වා පහත වැටිණි. විවරණයට භාජනය වන වර්ෂය තුළදී ශුද්ධ වශයෙන් තිල ප්‍රාග්ධන ගලා ඒම 1990 දී විගැහි දශ ලක්ෂ 298 ක සිට විගැහි දශ ලක්ෂ 390 දක්වා වැඩි වුණි. මේ අතර පසුගිය වසර දෙක තුළ ණය ආපසු ගෙවීම් එක මට්ටමක පැවති අතර, දිගු කාලීන ප්‍රාග්ධන ලැබීම් 1991 දී විගැහි දශ ලක්ෂ 461 දක්වා සියයට 18 කින් වැඩි විය.

ප්‍රාග්ධන ගිණුමෙන් ලැබුණු සම්පත් ප්‍රමාණය, ජංගම ගිණුමේ හිඟය ඉක්මවන පරිදි වූයෙන් ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් ප්‍රමාණය සියයට 34 ක වැඩිවීමක් වාර්තා කරමින් 1990 වසර අවසානයේදී වූ විගැහි දශ ලක්ෂ 602 සිට 1991 වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 809 දක්වා ඉහළ නැගුණි. 1991 වර්ෂය අවසානයේදී වූ දළ දේශීය වත්කම් ප්‍රමාණය 1992 වසර සඳහා අපේක්ෂිත ආනයනයන්ගෙන් මාස 4.2 ක වටිනාකම මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය.

1991 වසරේදී ශ්‍රී ලංකා රුපියලේ අගය එක්සත් ජනපද ඩොලරයට හැර අනිකුත් සියළු මුදල් වර්ගයන්ට ප්‍රතිමුඛව උච්ඡාවචනය විය. 1990 වසර අවසානය සහ 1991 වසර අවසානය අතර කාලය තුළ සියයට 5.5 ක මුළු පිරිහීමක් පෙන්වමින් වර්ෂය තුළදී රුපියල එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව පිරිහී ගියේය. මේ අතර ශ්‍රී ලංකා රුපියලේ අගය 1990 වසර අවසානයේ සිට 1991 වසර අවසානය අතර කාලය තුළ ජපාන යෙන්වලට ප්‍රතිමුඛව සියයට 13.2 කින් ද ඩොයිෂ් මාර්ක් වලට ප්‍රතිමුඛව සියයට 6.7 කින්ද, ප්‍රංශ ෆ්‍රෑන්ක් වලට ප්‍රතිමුඛව සියයට 5.9 කින්ද, එක්සත් රාජධානි පවුමට ප්‍රතිමුඛව සියයට 5.0 කින්ද, පිරිහිණි. මේ අතර ඉන්දියානු රුපියලේ අගය පහත හෙළීම හේතුවෙන් 1990 වසර අවසානයේ සිට 1991 වසර අවසානය අතර කාලය තුළ ශ්‍රී ලංකා රුපියලේ අගය ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 36.6 ක වැඩිවීමක් පිළිබිඹු කළේය.

1991 වසර අවසානයේදී ශ්‍රී ලංකාවේ නොපියවූ මුළු විදේශීය ණය විගැහි දශ ලක්ෂ 4,598 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. වසර තුළදී මුළු විදේශීය ණයෙහි විගැහි දශ ලක්ෂ 476 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. මෙම වැඩිවීමට වැඩි වශයෙන් හේතු වූයේ 1990 වසර අවසානයේදී වූ විගැහි දශ ලක්ෂ 3,190 සිට 1991 වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 3,601 දක්වා වැඩි වූ රජයේ මැදි හා දිගු කාලීන ණයයි. මේ අතර පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් ක්‍රමයේ ප්‍රථම අදියර යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් විගැහි දශ ලක්ෂ 56 ක් නිදහස් කළද 1990 වසර අවසානයේදී වූ විගැහි දශ ලක්ෂ 288 ක ප්‍රමාණය හා සසඳන කළ, පසුගිය ණය මුදල් ආපසු ගෙවීම වැඩිවීමේ හේතුවෙන්, මෙම වසර අගදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට නොගෙවා ඉතිරි වූ ණය ප්‍රමාණය විගැහි දශ ලක්ෂ 280 දක්වා අඩු විය. මේ අතර, නොගෙවා ඉතිරි වූ කෙටි කාලීන ණය ප්‍රමාණය, 1990 වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 294 සිට 1991 වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 349 දක්වා ඉහළ නැගිණි.

1991 වසරේදී මැදි හා දිගු කාලීන ණය ආපසු ගෙවීම් සහ අනිකුත් ණය සඳහා වන පොළී ගෙවීම් ද ඇතුළත්, ශ්‍රී ලංකාවේ ණය සේවා ගෙවීම්, විගැහි දශ ලක්ෂ 25 කින් වැඩි වී, විගැහි දශ ලක්ෂ 354 ක් විය. මෙම වැඩිවීම, ණය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් යන දෙවර්ගයෙහිම දක්නට ලැබිණි. ණය ආපසු ගෙවීම්වල සම්පූර්ණ වැඩිවීමම පාහේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කළ ණය ආපසු ගෙවීම් වලින් සමන්විත විය. මේ සමග 1990 සහ 1991 වසර දෙක අතර කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කළ පොළී ගෙවීම්, විගැහි දශ ලක්ෂ 21 සිට විගැහි දශ ලක්ෂ 15 දක්වා අඩු වූ අතර, අනිකුත් ණය සඳහා වූ පොළී ගෙවීම් විගැහි දශ ලක්ෂ 126 සිට විගැහි දශ ලක්ෂ 141 දක්වා ඉහළ නැගිණි. මේ අනුව, ණය සේවා ගෙවීම් භාණ්ඩ හා සේවා අපනයනයන්ගේ ඉපැයීම්වල අනුපාතයක් ලෙස ගත් විට 1991 දී සියයට 18.1 ක් වූ අතර මෙය 1990 දී පැවති මට්ටමට බොහෝ සෙයින්ම සමාන විය.

1991 දී රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය පවත්වා ගෙන යා හැකි අයවැය හිඟයක් පවත්වා ගැනීමට මෑත අතීතයේදී ගන්නා ලද උත්සාහයන්හි පසුබෑමක් පිළිබිඹු කරන ලදී. 1991 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවල පිරිහීමට හේතු වූයේ රජයේ ආදායම් වර්ධනය ප්‍රමාණවත් නොවීමක් සහ

වර්තන වියදම් විශාල ලෙස වැඩිවීමත් යන කරුණු දෙකයි. සමස්ත ආදායම් / දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය, 1990 වර්ෂයේ පැවති සියයට 21.2 සිට 1991 දී සියයට 20.3 දක්වා පහත වැටුණ අතර වර්තන වියදම් / දළ දේශීය නිෂ්පාදිත අනුපාතය පෙර වසරේ මට්ටමට බොහෝ සෙයින් සමානව සියයට 22.3 ක මට්ටමේ පැවතිණි. මේ අනුව වර්තන ගිණුමේ හිඟය / දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය, 1990 දී සියයට 1.2 සිට 1991 දී සියයට 2 දක්වා වැඩි විය. මේ අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස, වසර දෙක අතර කාලයේදී සියයට 8.8 සිට සියයට 9.5 දක්වා ඉහළ නැගිණි. පසුගිය වසර හා සසඳන කල්හී මෙම කරුණු දෙක මේ වසරේ මූල්‍ය ක්‍රියාකාරිත්වයේ කැපී පෙනෙන පිරිහීමකට දයක විය. සමස්ත රාජ්‍ය වියදම් / දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතය, 1990 වසරේදී සියයට 31.1 සිට 1991 දී සියයට 31.9 දක්වා ඉහළ නැගුණු අතර, වසර දෙක අතර කාලයේදී සමස්ත අයවැය හිඟය / දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය, සියයට 9.9 සිට සියයට 11.6 දක්වා ඉහළ නැගිණි. කෙසේ වුවත්, අයවැය හිඟය පියවීමේදී විදේශීය වත්කම් විශාල ප්‍රමාණයක් ලැබුණු නිසා දේශීය ණය සහ ප්‍රසාරණාත්මක ණය ගැනීම් සඳහා වූ අවශ්‍යතාවය ඉවත් කරණ ලදී.

1991 වසරේදී, සියයට 12 ක වැඩිවීමක් වාර්තා කරමින් රජයේ ආදායම රුපියල් දශ ලක්ෂ 76,179 ක් විය. කෙසේ වුවත්, රජයේ ආදායමේ සමස්ත වර්ධනය දළ ජාතික නිෂ්පාදිතයේ මූල්‍යමය වටිනාකමේ වැඩිවීමට වඩා අඩු වූයෙන් ආදායම් / දළ දේශීය නිෂ්පාදීතය අතර අනුපාතය 1990 දී පැවති සියයට 21.2 සිට 1991 දී සියයට 20.3 දක්වා පහතට වැටුණි. රුපියල් දශ ලක්ෂ 68,157 ක් වූ බදු ආදායම, පෙර වසරේදී මෙන්ම, මුළු ආදායමින් සියයට 90 කට දායක විය. කෙසේ වුවත් බදු පාරිශ්‍රමයේ සමහර අතපසු වීම් පිළිබිඹු කරමින්, බදු ආදායම / දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය 1990 දී සියයට 19.1 සිට 1991 දී සියයට 18.2 දක්වා පහත වැටිණි. මෙම අඩුවීමට වැඩි වශයෙන් හේතු වූයේ ආනයන මත පැන වූ පිරිවැටුම් බදු වල අඩු මට්ටමේ වර්ධනයත් අපනයන බදු ආදායම දිගින් දිගටම අඩු වීමත්ය. මේ අතර, රුපියල් දශ ලක්ෂ 8,022 ක් වූ බදු නොවන ආදායම, පෙර වසරට වඩා සියයට 19 ක ඉහළ නැගීමක් වාර්තා කළද බදු නොවන ආදායම් / දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය පෙර වසරේ මෙන්ම සියයට 2.1 මට්ටමේ නොවෙනස්ව පැවැතිණි. වැඩි වූ පොළී ආදායම, සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ රුපියල් දශ ලක්ෂ 2,612 ක් වූ පැවරුම් ද යන කරුණු දෙක, වර්ෂය තුළදී බදු නොවන ආදායමේ වේගවත් ඉහළ යාමට බලපෑ හේතු විය.

බදු ආදායමේ මූලාශ්‍රයන් අතරින් බදු පදනමට ඉතාමත් වැදගත් ලෙස දායක වූයේ රුපියල් දශ ලක්ෂ 32,107 ක් හෙවත් මුළු බදු ආදායමින් සියයට 47 කට දායක වූ දේශීය භාණ්ඩ සහ සේවා මත පැන වූ බදුයි. අනික් අතින් මෑත වර්ෂයන්හි නොකඩවා දක්නට ලැබුණු පහත වැටීමේ නැඹුරුව අනුව යමින්, ජාත්‍යන්තර වෙළඳාම ආශ්‍රිත බදු 1990 දී සියයට 32, සිට 1991 දී සියයට 29 දක්වා පහත වැටිණි. බදු ආදායම 1990 දී රුපියල් දශ ලක්ෂ 19,341 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 19,754 දක්වා ආන්තික වශයෙන් පමණක් වූ වැඩි වීමක් පෙන්විය. මේ අතර, ආදායම් බදුවල සාපේක්ෂ වැදගත්කම සියයට 12 සිට සියයට 14 දක්වා වැඩි වූ අතර එම බදු ආදායම් රුපියල් දශ ලක්ෂ 7,337 සිට රුපියල් දශ ලක්ෂ 9,722 දක්වා ඉහළ ගොස් වසර දෙක අතර සියයට 33 ක වැඩිවීමක් පෙන්නුම් කළේය.

වියදම් අංශයෙන් සලකා බලන විට, රුපියල් දශ ලක්ෂ 83,756 ක් වූ වර්තන වියදම්, 1991 දී සියයට 17 ක වැඩිවීමක් වාර්තා කළද, වර්තන වියදම් / දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතය මෙම වසර දෙක අතර කාලයේදී බොහෝ දුරට නොවෙනස්ව, සියයට 22.3 ක මට්ටමක පැවතිණි. රුපියල් දශ ලක්ෂ 35,583 ක් වූ භාණ්ඩ හා සේවා මිලට ගැනීමේ වියදම, සියයට 18 ක වැඩිවීමක් වාර්තා කළ අතර, මුළු වර්තන වියදම් සඳහා එහි දායකත්වය 1990 වසරේදී පැවති සියයට 42 මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. මේ අතර රුපියල් දශ ලක්ෂ 26,100 ක් වූ වර්තන සංක්‍රාම, සියයට 21 ක වැඩිවීමක් පිළිබිඹු කළ අතර, මුළු වර්තන වියදම් සඳහා මේවායේ දායකත්වය, පසුගිය වසරේ වූ සියයට 29 සිට මේ වසරේ සියයට 31 දක්වා ඉහළ නැගිණි. රුපියල් දශ ලක්ෂ 22,073 ක් වූ රාජ්‍ය ණය සඳහා වූ පොළී ගෙවීම් සියයට 7 ක සාමාන්‍ය වර්ධනයක් පෙන් වූ අතර, 1990 දී වූ සියයට 29 හා සංසන්දනාත්මකව වර්තන වියදම්වලින් සියයට 26 කට දායක විය.

## 1.4 සංඛ්‍යා සටහන

### රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1987 | 1988 | 1989 | 1990 | 1991 අනුමතකළ ඇස්තමේන්තු | 1991 තාවකාලික | 1992 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදයම සහ දීමනා** | **46,822** | **48,337** | **60,386** | **74,661** | **78,669** | **84,049** | **93,720** |
| **මුළු ආදයම** | **42,145** | **41,749** | **53,979** | **67,964** | **70,669** | **76,179** | **85,000** |
| බදු ආදයම | 35,119 | 35,946 | 47,513 | 61,206 | 64,899 | 68,157 | 76,575 |
| බදු - නොවන ආදයම | 7,026 | 5,803 | 6,466 | 6,758 | 5,770 | 8,022 | 8,425 |
| **දීමනා** | **4,677** | **6,588** | **6,407** | **6,697** | **8,000** | **7,870** | **8,720** |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම්** | **63,894** | **76,532** | **82,164** | **99,814** | **106,691** | **119,527** | **124,010** |
| වර්තන | 39,560 | 46,132 | 56,884 | 71,771 | 72,962 | 83,756 | 84,327 |
| ප්‍රාග්ධන | 22,816 | 22,878 | 20,750 | 19,161 | 28,118 | 25,968 | 34,475 |
| ආපසු ගෙවීම් අඩු කළ පසු ණයදීම් | 1,518 | 7,522 | 4,530 | 8,882 | 5,611 | 9,803 | 5,208 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (-)** | **2,585** | **-4,383** | **-2,905** | **-3,807** | **-2,293** | **-7,577** | **673** |
| **අයවැය හිඟය (දීමනාවලට පෙර)** | **-21,749** | **-34,783** | **-28,185** | **-31,850** | **-36,022** | **-43,348** | **-39,010** |
| **අයවැය හිඟය (දීමනාවලට පසු)** | **-17,072** | **-28,195** | **-21,778** | **-25,153** | **-28,022** | **-35,478** | **-30,290** |
| **පියවීම** | **17,072** | **28,193** | **21,777** | **25,152** | **28,022** | **35,478** | **30,290** |
| **විදේශීය ණය ගැනීම්** | **5,716** | **7,128** | **5,926** | **11,644** | **19,883** | **19,329** | **20,793** |
| **දේශීය ණය ගැනීම්** | **11,356** | **21,065** | **12,373** | **16,986** | **8,139** | **16,149** | **9,497** |
| වෙළඳ පොළ නොවන (අ) | 1,415 | 1,685 | 1,822 | 3,538 | – | 1,667 | – |
| වෙළඳ පොළ | 9,941 | 19,380 | 10,551 | 13,448 | 8,139 | 14,482 | 9,497 |
| බැංකු - නොවන | 6,400 | 9,227 | 13,837 | 13,074 | 12,639 | 15,358 | 9,497 |
| බැංකු | 3,541 | 10,153 | -3,286 | 374 | -4,500 | -876 | – |
| *දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්* | | | | | | | |
| **මුළු ආදයම සහ දීමනා** | **23.8** | **21.8** | **24.0** | **23.3** | **21.4** | **22.4** | **21.2** |
| **මුළු ආදයම** | **21.4** | **18.8** | **21.4** | **21.2** | **19.3** | **20.3** | **19.2** |
| බදු ආදයම | 17.9 | 16.2 | 18.9 | 19.1 | 17.7 | 18.2 | 17.3 |
| බදු - නොවන ආදයම | 3.6 | 2.6 | 2.6 | 2.1 | 1.6 | 2.1 | 1.9 |
| **දීමනා** | **2.4** | **3.0** | **2.5** | **2.1** | **2.2** | **2.1** | **2.0** |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ. පසු ණය දීම්** | **32.5** | **34.5** | **32.6** | **31.1** | **29.1** | **31.9** | **28.0** |
| වර්තන | 20.1 | 20.8 | 22.6 | 22.4 | 19.9 | 22,3 | 19.0 |
| ප්‍රාග්ධන | 11.6 | 10.3 | 8.2 | 6.0 | 7.7 | 6.9 | 7.8 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණයදීම් | 0.8 | 3.4 | 1.8 | 2.8 | 1.5 | 2.6 | 1.2 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (-)** | **1.3** | **-2.0** | **-1.2** | **-1.2** | **-0.6** | **-2.0** | **0.2** |
| **අයවැය හිඟය (දීමනාවලට පෙර)** | **-11.1** | **-15.7** | **-11.2** | **-9.9** | **-9.8** | **-11.6** | **-8.8** |
| **අයවැය හිඟය (දීමනාවලට පසු)** | **-8.7** | **-12.7** | **-8.6** | **-7.8** | **-7.6** | **-9.5** | **-6.8** |
| **පියවීම** | **8.7** | **12.7** | **8.6** | **7.8** | **7.6** | **9.5** | **6.8** |
| **විදේශීය ණය ගැනීම්** | **2.9** | **3.2** | **2.4** | **3.6** | **5.4** | **5.2** | **4.7** |
| **දේශීය ණය ගැනීම්** | **5.8** | **9.5** | **4.9** | **5.3** | **2.2** | **4.3** | **2.1** |
| වෙළඳ පොළ නොවන (අ) | 0.7 | 0.8 | 0.7 | 1.1 | – | 0.4 | – |
| වෙළඳ පොළ | 5.1 | 8.7 | 4.2 | 4.2 | 2.2 | 3.9 | 2.1 |
| බැංකු නොවන | 3.3 | 4.2 | 5.5 | 4.1 | 3.4 | 4.1 | 2.1 |
| බැංකු | 1.8 | 4.6 | -1.3 | 0.1 | -1.2 | -0.2 | – |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1989 දී හිඟ වියදම් රුපියල් දශ ලක්ෂ 3,478 කින් වැඩිවීම සහ 1990 හිඟ වියදම් රුපියල් දශ ලක්ෂ 3,478 කින් අඩුවීම සඳහා ගැලපීම් කර ඇත.

පුස්තකාලය
මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
මොරටුව.


1991 දී මුළු ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 35,771 ක් වී, පෙර වසරේ සිට සියයට 28 ක වැඩිවීමක් පිළිබිඹු කළේය. රුපියල් දශ ලක්ෂ 14,888 ක් වූ ස්ථාවර වත්කම් ගොඩනැගීම් සහ පවත්වා ගැනීම් සඳහා වූ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල සෘජු ප්‍රාග්ධන වියදම් සියයට 28 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මේ අතර රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල දියත් කිරීමට සම්බන්ධ වූ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා වෙනුවෙන් ලබා දෙන ලද ප්‍රාග්ධන සංක්‍රාම සියයට 50 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 9,830 ක් විය. රාජ්‍ය වෙළෙඳ ව්‍යාපාර සඳහා රජය ලබා ගත් ණය, නැවත ණය වශයෙන් ලබා දීම යටතේ රුපියල් දශ ලක්ෂ 6,622 ක් තිකුත් කළ අතර එහි ප්‍රධාන ප්‍රතිලාභියා වූයේ ලංකා විදුලි බල මණ්ඩලයයි. මේ අතර අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරිත්වය, රජයේ වියදම් තත්ත්වය තවදුරටත් බැරෑරුම් තත්ත්වයකට පත් කරමින්, රුපියල් දශ ලක්ෂ 1,819 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. අතික් අතින් විවිධ ව්‍යාපාර සඳහා දෙන ලද ණය මුදල් වලින් රුපියල් දශ ලක්ෂ 1,132 ක් නැවත ලබා ගැණිනි. මෙම ගණුදෙනුවල ඒකාබද්ධ බලපෑම වූයේ වසර තුළදී ශුද්ධ ණය දීම් රුපියල් දශ ලක්ෂ 9,803 ක ප්‍රමාණයක් වීමයි.

රජයේ සමස්ත ආදායම් හා වියදම් ගැලීම් ප්‍රවාහයන් අනුව අයවැය හිඟය (දීමනා වලට පෙර) 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 31,850 සමග සසඳන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 43,348 ක් දක්වා සියයට 36 ක වැඩිවීමක් පෙන්විය. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ, මෙම හිඟය 1990 දී සියයට 9.9 සිට 1991 දී සියයට 11.6 දක්වා පුළුල් විය. ණය සහ දීමනා වශයෙන් විදේශීය මූලාශ්‍රයන්ගෙන් ලැබුණු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 27,199 ක් (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.3 ක්) වූ අතර මෙමගින් හිඟය පියවීමට අවශ්‍ය මුදලින් ආසන්න වශයෙන් තුනෙන් දෙපංගුවක් සැපයුණි. මෙය ඊට පෙර වසරේ සියයට 58 ක් විය. තවද, පුළුල් වූ හිඟයක් පැවතියද, සම්පත් රාශියක් විදේශ වත්කම් යටතේ ලැබීම හේතුකොට ගෙන අයවැය කටයුතු සඳහා ලබාගත් දේශීය ණය ප්‍රමාණය පෙර වසරේ රුපියල් දශ ලක්ෂ 16,986 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.3ක්) හා සසඳන විට මේ වසරේදී රුපියල් දශ ලක්ෂ 16,149 ක් (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.3) විය. දේශීය මූලාශ්‍රයන්ගේ සම්පත් රාශිකරණය කිරීමේදී ණය අවශ්‍යතාවයන් මුළුමනින්ම සපුරා ගත්තා ලද්දේ බැංකු නොවන අංශයෙනි. තවද, 1991 දී රජයට දෙවැනි වසරටත් අයවැය කටයුතු සඳහා උද්ධමනාත්මක මූල්‍ය කරණයන් උපයෝගී කර ගැනීම මග හැරීමට හැකි විය. 1991 දී අයවැය ක්‍රියාකාරිත්වය රජය විසින් බැංකු අංශයට කරන ලද රුපියල් දශ ලක්ෂ 876 ක ණය ආපසු ගෙවීමක් වාර්තා කළේය.

1991 වසර අවසානයේදී නොගෙවා ඉතිරි වූ රාජ්‍ය ණය, ඊට පෙර වසරේ වූ මට්ටමට වඩා සියයට 18 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 366,697 ක් විය. මුළු ණයෙන් දේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 152,118 ක් හෙවත් සියයට 42 ක් වූ අතර, විදේශ ණය රුපියල් දශ ලක්ෂ 214,579 ක් හෙවත් මුළු ණයෙන් සියයට 58 ක් නියෝජනය කළේය. දේශීය ණය සලකා බලන විට කෙටි කාලීන ණය (වසරකට අඩු කල්පිරීමත් සහිත) රුපියල් දශ ලක්ෂ 84,503 ක් හෙවත් සියයට 56 ක් විය. කෙටි කාලීන ණය වලින් ආසන්න වශයෙන් සියයට 90ක් සමන්විත වූයේ රුපියල් දශ ලක්ෂ 72,968 ක් වූ භාණ්ඩාගාර බිල්පත් වලිනි. මේ අතර බැංකු නොවන අංශයෙන් ගත් දේශීය ණය සියයට 18 ක වර්ධනයක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 99,132 ක් වූ අතර, බැංකු අංශය විසින් දැරූ ණය සියයට 8 ක සාමාන්‍ය වැඩිවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 52,146 ක් විය. සමස්තයක් ලෙස බැංකු අංශය විසින් දැරූ ණය කොටස 1990 දී සියයට 36 ක සිට 1991 දී සියයට 34 දක්වා ඉතා සුළු වශයෙන් අඩු විය.

දේශීය ණය සංයුතියෙහි රුපියල් සුරකුම්පත් සඳහා තිබූ වගකීම් ප්‍රමාණය පෙර වසරට වඩා සියයට 22 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 66,824 ක් විය. මෑත අතීතයේ රටාව අනුව යමින් මෙම සුරකුම් සඳහා ප්‍රධාන දායකයන් වූයේ ප්‍රධාන ග්‍රාහක මූලයන් වන සේවක අර්ථ සාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි. මේ අතර භාණ්ඩාගාර බිල්පත් යටතේ වගකීම් රුපියල් දශ ලක්ෂ 5,000 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1990 දී රුපියල් දශ ලක්ෂ 67,968 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 72,968 දක්වා ඉහළ නැගුණි. බැංකු අංශයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම සියයට 7 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 44,271 ක් වූ අතර, බැංකු

37458

නොවන අංශයේ මෙම දැරීම් ඊට සමාන ප්‍රතිශතයකින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 28,697 ක් විය. කෙසේ වුවද, බැංකු අංශය මගින් තබා ගත් භාණ්ඩාගාර බිල්පත් වල මුළු වැඩිවීම මහ බැංකුව විසින් ග්‍රහණය කරන ලැබූ අතර එම වගකීම 1990 දී රුපියල් දශ ලක්ෂ 30,654 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 35,032 දක්වා විය.

පැවැති විදේශීය ණය වගකීම් ප්‍රමාණය වසර තුළදී රුපියල් දශ ලක්ෂ 37,696 ක හෙවත් සියයට 21 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 214,579 ක් විය. කෙසේ වුවත් මෙම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 21,074 ක ශුද්ධ අතිරේක විදේශීය ණය ගැනීම් සහ රුපියල් දශ ලක්ෂ 16,622 ක විනිමය අනුපාතිකයේ වෙනස් වීම් යටතේ වැඩි වූ වගකීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 1991 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 124,471 ක් වූ ද්විපාර්ශ්විය ණය, සහනදායී කොන්දේසි යටතේ ලැබූ ණය වලින් සියයට 61 කට දයක වූ අතර රුපියල් දශ ලක්ෂ 78,084 ක් වූ බහු පාර්ශවීය ණය, ඉතිරි සියයට 39 ට දයක වී ඇත. ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් ඇතුළත් රජයේ ණය සේවාකරණ ගෙවීම් 1991 දී රුපියල් දශ ලක්ෂ 39,855 ක් වූ අතර එය 1990 දී වර්තා කළ සියයට 38 ක සාපේක්ෂව තියුණු වර්ධනය හා සසඳන විට සියයට 22 ක වැඩිවීමක් වාර්තා කළේය. රජයේ ණය සේවාකරණ ගෙවීම් දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1990 දී සියයට 10.2 සිට 1991 දී සියයට 10.6 දක්වා සුළු වැඩි වීමක් පෙන්විය. මුළු ණය සේවාකරණ ගෙවීම් වලින් විදේශ ණය සඳහා වූ ගෙවීම් සියයට 4 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 8,994 ක් වූ අතර, දේශීය ණය සඳහා වූ ගෙවීම් පෙර වසරට වඩා සියයට 8 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 30,861 ක් විය.

බැංකු ක්‍රමයේ ශුද්ධ විදේශීය වත්කම්හි සැළකිය යුතු දියුණුව සහ දේශීය ණයෙහි නොකඩවා පැවති අධික වර්ධනය නිසා මූල්‍ය ප්‍රසාරණ වේගය 1991 දී තවදුරටත් වර්ධනය විය. මහජනයා සතු ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත වූ පටු මුදල් සැපයුම ($M_1$) 1990 දී වූ සියයට 13 ක වර්ධනය හා සසඳන විට 1991 දී සියයට 18 කින් පුළුල් විය. මීට සමාන නැඹුරුවක් අනුගමනය කරමින් පටු මුදල් සැපයුමේ සහ වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු කාලීන සහ ඉතුරුම් තැන්පතු වලින් සමන්විත වූ පුළුල් මුදල් සැපයු මේ වාර්ෂික වර්ධනය ($M_2$) මෙම වසර දෙක අතර කාලයේදී සියයට 19 සිට සියයට 23 දක්වා ඉහළ නැගිණි. නොකඩවාම දැඩි සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගෙන ගියද මූල්‍ය වර්ධන වේගය තවත් වේගවත් විය. නොකඩවා ඉහළ ගිය බැංකු ක්‍රමයේ විදේශීය වත්කම්වලට අමතරව සාර්ව ආර්ථික වැඩපිළිවෙල යටතේ රාජ්‍ය මූල්‍ය ඉලක්කයන් අපේක්ෂිත පරිදි ළඟා කර ගැනීමට නොහැකි වීමද, ඉහළ මූල්‍ය ප්‍රසාරණ වේගයට හේතු විය.

පෙර වසරේ මෙන් 1991 දී ද මුදල් සැපයුමේ වර්ධනය වැඩි වශයෙන් පැහැදිලි වූයේ පුළුල් මුදල් සමස්තයෙහිය. මෙයට හේතු වූයේ ආසන්න මුදල්වල නොකඩවා පැවති වැඩි වීමයි. 1990 දී රුපියල් දශ ලක්ෂ 10,044 ක හෙවත් සියයට 24 ක වර්ධනයක් පෙන්වූ ආසන්න මුදල් 1991 දී රුපියල් දශ ලක්ෂ 13,904 ක හෙවත් සියයට 27 ක වර්ධනයක් පෙන් විය. මෙම වැඩිවීම බොහෝ සෙයින් පිළිබිඹු වූයේ පෙර වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 9,578 ක් හෙවත් සියයට 27 ක වර්ධනය හා සසඳන කළ 1991 දී රුපියල් දශ ලක්ෂ 10,243 ක හෙවත් සියයට 22 ක වැඩිවීමක් පෙන් වූ අනෙකුත් පෞද්ගලික අංශයෙහි ගණුදෙනුකරුවන්ගේ කාලීන හා ඉතුරුම් තැන්පතු වලය. ආසන්න මුදල්වල මෙම සැළකිය යුතු ප්‍රමාණයක වැඩි වීම ප්‍රධාන වශයෙන් වර්ෂය තුළදී බැංකුවල විදේශීය වත්කම් පුළුල් වීම නිසා සිදු වූවක් ලෙස දැක්විය හැක.

1990 දී වූ රුපියල් දශ ලක්ෂ 4,789 ක හෙවත් සියයට 18 ක ඉතා අඩු වේගයකින් සිදු වැඩි වීම හා සසඳන විට 1991 දී මූල්‍ය පදනම (සංචිත මුදල්) රුපියල් දශ ලක්ෂ 8,476 ක හෙවත් සියයට 27 ක වැඩිවීමක් වාර්තා කළේය. මූලාශ්‍ර අංශයෙහිලා සලකන කල මෙම වැඩිවීමට වැඩිම වශයෙන් හේතු වූයේ, රුපියල් දශ ලක්ෂ 8,811 ක සැළකිය යුතු පුළුල්වීමක් දැක් වූ මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම්ය. මීට ප්‍රතිවිරුද්ධව වසර තුළදී බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 334 කින් පහත වැටිණි. මෙම ශුද්ධ දේශීය වත්කම්වල පහත වැටීම මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණයෙහි රුපියල් දශ ලක්ෂ 1,986 ක විශාල අඩු වීමක් නිසා සිදු වූවකි.

## 1.5 සංඛ්‍යා සටහන

### මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1986 - 1991

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
|---|---|---|---|---|---|---|
| දේශීය ණයෙහි වෙනස | 4,883 | 11,457 | 21,302 | 5,454 | 17,543 | 14,362 |
| රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීම | 2,198 | 4,502 | 9,017 | 54 | 3,078 | 2,595 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය වැඩිවීම | 301 | 2,627 | 3,421 | 3075 | 1,774 | -1,559 |
| සමුපකාර ආයතනවලට දෙන ලද ණය වැඩිවීම | 120 | -301 | 195 | -140 | 418 | 161 |
| අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වැඩිවීම | 2,263 | 4,629 | 8,669 | 2,465 | 12,273 | 13,165 |
| බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වෙනස | -3 | 111 | -2,233 | -2,326 | 5,474 | 7,099 |
| මුළු වත්කම්/වගකීම් හි වෙනස | 4,880 | 11,568 | 19,069 | 3,128 | 23,017 | 21,461 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) වැඩිවීම | 2,451 | 7,475 | 9,611 | 8,487 | 14,584 | 21,080 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම | 2,428 | 4,093 | 9,458 | -5,359 | 8,433 | 381 |
| මූල්‍ය කටයුතුවල වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | | | | | | |
| මුළු දේශීය ණය වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | 8.2 | 17.9 | 28.2 | 5.6 | 17.1 | 12.0 |
| මුළු වත්කම්/වගකීම් වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | 7.1 | 15.8 | 22.4 | 3.0 | 17.7 | 16.4 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රාජ්‍ය අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | 45.0 | 39.3 | 42.3 | 1.0 | 17.5 | 18.1 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රාජ්‍ය නොවන අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | 55.0 | 60.7 | 57.7 | 99.0 | 82.5 | 81.9 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 5.1 | 14.7 | 16.4 | 12.4 | 19.1 | 23.2 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 12.9 | 18.4 | 29.1 | 9.1 | 12.8 | 18.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1991 දී මූල්‍ය කටයුතු සහ ණය සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ දේශීය ණයෙහි වූ සැලකිය යුතු වර්ධන යයි. 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 17,543 ක හෙවත් සියයට 17 ක විශාල වර්ධනය අනුව යමින්, 1991 දී දේශීය ණය රුපියල් දශ ලක්ෂ 14,362 කින් හෙවත් සියයට 12 කින් පුළුල් විය. වර්ෂය තුළ ණය වර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකම දායක වූ නමුත්, ඉතාම විශාල කොටසකට දායක වූයේ පෞද්ගලික අංශයයි. සමස්තයක් වශයෙන් 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 14,465 හෙවත් සියයට 22 ක වැඩිවීම හා සසඳන විට පෞද්ගලික අංශයට ලබා දෙන ලද දළ ණය ප්‍රමාණය 1991 දී රුපියල් දශ ලක්ෂ 11,767 කින් හෙවත් සියයට 15 කින් වැඩි විය. මේ අතර, බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය, 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 3,078 ක හෙවත් සියයට 9 ක වැඩිවීම හා සසඳන කල, 1991 දී රුපියල් දශ ලක්ෂ 2,595 කින් හෙවත් සියයට 7 කින් පුළුල් විය.

වර්ෂය තුළදී පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි දක්නට ලැබුණ අඛණ්ඩ ඉහළ වර්ධනය මෑත අතීතයේදී වැඩි දුරටත් ක්‍රියාත්මක කරන්නට යෙදුනු ආර්ථික ලිහිල් කිරීම සහ ප්‍රතිපත්ති හේතුවෙන් දියුණු වූ ව්‍යාපාරික පසු තලයක් තුළ පැවති ඉහළ මට්ටමේ ආර්ථික ක්‍රියාකාරීත්වය පිළිබිඹු කිරීමක් විය. පෞද්ගලික අංශය තුළ ලබා දුන් බැංකු ණයෙන් විශාලම කොටස උපයෝජනය කළේ අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන්ය. (එනම් රාජ්‍ය සංස්ථා සහ සමුපකාර අංශය හැර අනෙකුත් පෞද්ගලික අංශයයි.) මුළුමනින්ම සළකා බලන කල මෙම අංශයට ලබා දෙන ලද බැංකු ණය 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 12,273 හෙවත් සියයට 24 හා සසඳන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 13,164 කින් හෙවත් සියයට 21 කින් ඉහළ නැගිණ.

මේ අතර වාණිජ බැංකු විසින් රාජ්‍ය සංස්ථාවන්ට ලබා දෙන ලද ණය 1991 දී රුපියල් දශ ලක්ෂ 1,559 කින් හෙවත් සියයට 10 කින් පහත වැටිණි. කෙසේ වුවත්, රාජ්‍ය සංස්ථාවලට දුන් ණයෙහි අඩු වීම හුදෙක් විධික (technical) පහත වැටීමක් වූ අතර වාණිජ බැංකු විසින් මධ්‍යකාලීන ආයෝජන වැඩ පිළිවෙල යටතේ සහ තේ නැවත වගා කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙල යටතේ වැවිලි සංස්ථා දෙක වෙතට ලබා දුන් ණය රජය විසින් එම ආයතනවල කොටස් ප්‍රාග්ධනය වශයෙන් ප්‍රේෂණය කිරීමේ ප්‍රතිඵලයක් විය. 1991 දී මෙසේ ප්‍රේෂණය කරන ලද වටිනාකම රුපියල් දශ ලක්ෂ 3,238 ක් විය. මෙම ප්‍රේෂණය නොසලකා හැරි විට, නොකඩවා පැවැති පාඩු සහගත තත්ත්වය හේතුවෙන්, මෙම සංස්ථා දෙක විශාල වශයෙන් බැංකු ණයෙහි පිහිට පැතූ බව පැහැදිලි වේ. මේ අතර, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට දුන් බැංකු ණය 1990 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,856 සිට 1991 වසර අවසානයට රුපියල් දශ ලක්ෂ 2,836 දක්වා අඩු විය. අනික් අතට, නොකඩවා පැවතුණු පාඩු, සමහර ආනයනික භාණ්ඩයන්හි මිළ ඉහළ නැගීම් සහ ඉහළ පොළී පිරිවැය නිසා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය අවශ්‍යතාවන් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 2,663 කින් සැළකිය යුතු අන්දමින් වැඩිවුණි. මේ අතර 1990 දී රුපියල් දශ ලක්ෂ 418 කින් පුළුල් වූ සමුපකාර අංශයට ලබා දුන් බැංකු ණය, 1991 දී රුපියල් දශ ලක්ෂ 161 ක සුළු වැඩිවීමක් වාර්තා කරන ලදී.

1991 දී බැංකු ක්‍රමය විසින් රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,595 කින් හෙවත් සියයට 7 කින් ඉහළ නැගිණි. මෙයින් වැඩි කොටසකට දායක වූයේ රුපියල් දශ ලක්ෂ 2,351 කින් ඉහළ ගිය මහ බැංකුව විසින් ලබා දෙන ලද ණයයි. කෙසේ වුවත් මහ බැංකුව විසින් රජයට දුන් ණය සහ අත්තිකාරම්වලට වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වගකීම් නැවත තක්සේරු කිරීමේ ගැලපිලි මත වූ රුපියල් දශ ලක්ෂ 2,949 ක විශේෂ ණයක් ද අඩංගු විය. මෙම අයිතමය ඉවත් කළ විට, 1991 වසර තුළ රජය විසින් අයවැය කටයුතු සඳහා යොදා ගන්නා ලද බැංකු ණයෙහි රුපියල් දශ ලක්ෂ 354 ක අඩු වීමක් දක්නට ලැබිණි.

1991 දී විදේශීය අංශය, අඛණ්ඩව දෙවන වසරටත් මුදල් සැපයුම මත විශාල ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන ලදී. මුළුමනින්ම සලකා බලන විට බැංකු ක්‍රමයේ ශුද්ධ විදේශීය වත්කම් 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 5,474 ක හෙවත් සියයට 116 ක වැඩිවීමකින් පසුව 1991 දී රුපියල් දශ ලක්ෂ 7,099 ක හෙවත් සියයට 70 ක ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ශුද්ධ විදේශීය වත්කම්වල මෙම වැඩිවීම සම්පූර්ණ වශයෙන්ම පිළිබිඹු වූයේ වසරේ දෙවන භාගයේදීය. 1991 වසරේ ජූලි සහ දෙසැම්බර් අතර කාලය තුළ මෙම වත්කම් රුපියල් දශ ලක්ෂ 7,285 කින් වැඩිවිය. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ පිරිහීමක් පැවතුණද, වර්ෂය තුළදී ආර්ථික යේ ව්‍යුහාත්මක ගැලපීම් වැඩපිළිවෙල යටතේ ලැබුණ ණය ප්‍රමාණය වැඩිවීම බැංකු ක්‍රමයේ විදේශීය වත්කම් ඉහළ යෑමට විශාල වශයෙන් හේතු විය.

1991 දී වාණිජ බැංකු ක්‍රමයේ සමස්ත ද්‍රවශීල තත්ත්වය සතුටුදායක මට්ටමක පැවතුණි. ද්‍රවශීල වත්කම් සහ ඉල්ලුම් තැන්පතු අතර අනුපාතය 1990 වසර අවසානයේ සියයට 149 සිට 1991 වසර අවසානයේදී සියයට 160 දක්වා ඉහළ නංවමින් ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,426 කින්ද ද්‍රවශීල වත්කම් රුපියල් දශ ලක්ෂ 8,563 කින්ද වැඩිවුණි. බැංකු ක්‍රමයේ සමස්ත ද්‍රවශීල තත්ත්වය තවදුරටත් දියුණු වුවද, ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළේ ගණුදෙනුද ඉහළ මට්ටමක පැවතිණි. මේ සඳහා වැඩි වශයෙන් හේතු වූයේ හිගයන් සහිත බැංකු වලින් ණය සඳහා වූ ඉල්ලුම වැඩිවීම නිතරම පාහේ සිදුවීමයි. මේ අනුව ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළේ පොළී අනුපාතික 1990 දෙසැම්බර් මස වූ සියයට 14-19 පරාසයේ සිට 1991 දෙසැම්බර් මාසයේදී සියයට 13-27 දක්වා වැඩිවිය.

1991 වර්ෂයේදී අඛණ්ඩව දෙවන වසරටත් රටේ බැංකු ශාඛා පද්ධතියේ සැළකිය යුතු වැඩිවීමක් පෙන්විය. 1990 දී නව බැංකු ශාඛා ප්‍රමාණය 49 කින් වැඩිවුණ අතර රටේ බැංකු ඝනත්වය ඉහළ නංවමින් 1991 දී තවත් නව බැංකු ශාඛා 50 ක් විවෘත කරනු ලැබීය. මෙම නව බැංකු ශාඛා 50 වාණිජ බැංකු ශාඛා 22 කින්ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 23 කින් හා ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා 5 කින්ද යුක්ත විය. 1991 දී වාණිජ බැංකු ශාඛා ව්‍යාප්තියේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ නව ශාඛා ආරම්භ කිරීමේදී පෞද්ගලික වාණිජ බැංකු දැක් වූ

ප්‍රමුඛත්වයයි. පෞද්ගලික වාණිජ බැංකු විසින් නව බැංකු ශාඛා 17 ක් විවෘත කරන ලද අතර රාජ්‍ය අංශයේ බැංකු විසින් විවෘත කරන ලද්දේ නව ශාඛාවන් 5 ක් පමණකි. පෞද්ගලික අංශයේ බැංකු ශාඛා විවෘත කිරීම්වලට විදේශීය වාණිජ බැංකු විසින් විවෘත කරන ලද ශාඛාවන් 3 ක්ද, ඇතුළත් වේ. 1991 දී දක්නට ලැබුණු වාණිජ බැංකු පුළුල්වීම ආර්ථික ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමෙහිලා පෞද්ගලික අංශය විසින් ප්‍රධාන කොටසක් ඉෂ්ඨ කෙරෙතැයි බලාපොරොත්තු වූ ප්‍රතිපත්තියට අනුකූලවිය. මේ අතරම මෙය බැංකු අංශයේ ශාඛා අතර හොඳ තරඟකාරිත්වයක් ඇති කිරීමට දක්වන උනන්දුවේ පිළිබිඹුවක් ද වේ.

අඛණ්ඩව දෙවන වසරටත් මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් 1990 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 14,692 ක හෙවත් සියයට 23 ක ඉහළ යාම හා සසඳන කළ 1991 වර්ෂයේදී සාපේක්ෂ වශයෙන් තියුණු වැඩිවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 18,373 කින් හෙවත් සියයට 24 කින් වැඩිවිය. වත්කම් අංශය සලකා බලන විට, විදේශීය සහ දේශීය වත්කම් යන දෙවර්ගයම ඉහළ ගියද මෙයින් ඉතාම වැඩි කොටසක් සඳහා දායක වූයේ විදේශීය වත්කම්ය. මහ බැංකුවේ දළ ජාත්‍යන්තර සංචිත 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 6,436 ක හෙවත් සියයට 65 ක වැඩිවීම අනුව යමින් 1991 දී රුපියල් දශ ලක්ෂ 12,557 ක හෙවත් සියයට 77 ක ඉහළ වැඩිවීමක් වාර්තා කරන ලදී. මේ අතර බැංකුවේ දේශීය වත්කම් (වෙනත් වත්කම් සහ ගිණුම් හැර) 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 4,483 ක හෙවත් සියයට 11 ක වැඩිවීම අනුව යමින් රුපියල් දශ ලක්ෂ 5,789 කින් හෙවත් සියයට 13 කින් වැඩි විය. දේශීය වත්කම් අතරින් රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 4,955 කින් හෙවත් සියයට 44 කින් වැඩිවිය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිණුම් අංක 1 නැවත ඇගයීම් සහ හිමිකම් ගැලපීම් පියවීම සඳහා රජයට ලබා දුන් රුපියල් දශ ලක්ෂ 2,949 ක විශේෂ ණය මුදලය. අනිත් අතට 1990 දී දක්නට ලැබුණු රුපියල් දශ ලක්ෂ 3,018 ක හෙවත් සියයට 70 ක තියුණු වැඩිවීමට ප්‍රතිවිරුද්ධව වාණිජ බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතනවලට ලබා දුන් ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,986 කින් හෙවත් සියයට 27 කින් පහත වැටිණි. මෙම අඩුවීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 3,391 කින් අඩු වූ කෙටි කාලීන ප්‍රතිමූල්‍ය පහසුකම්වලය.

වගකීම් අංශය සම්බන්ධයෙන් බලන කළ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ තැන්පතු වලින් සමන්විත වූ මූල්‍ය වගකීම් 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 11,661 ක හෙවත් සියයට 33 ක වැඩිවීම හා සසඳන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 17,682 කින් හෙවත් සියයට 37 කින් වැඩි වීමක් වාර්තා කළේය. සංසරණයේ පැවැති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,622 කින් සහ තැන්පතු වගකීම් රුපියල් දශ ලක්ෂ 14,060 කින් ද වැඩි වුණි. මූල්‍ය ක්‍රමය මත නොකඩවා පැවති පීඩනය පිළිබිඹු කෙරෙමින්, 1991 වර්ෂය මූල්‍ය වගකීම්වල තියුණු වැඩිවීමක් අඛණ්ඩව පෙන්වූ දෙවන වර්ෂය විය. තැන්පතු වගකීම් අතරින් රජයේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 5,424 කින් ඉහළ නැගුණු අතර, වාණිජ බැංකු තැන්පතු රුපියල් දශ ලක්ෂ 4,969 කින් ඉහළ නැගිණි. රජයේ තැන්පතුවල විශාල වැඩිවීමට වර්ෂය අවසානයේදී රජයට විදේශීය ණය කල් තබා ලැබීම හේතු වූ අතර 1991 ජනවාරි මාසයේදී මුදල් සංචිත අනුපාතය වෙනස් කිරීම වාණිජ බැංකු තැන්පතුවල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

මූල්‍ය තත්ත්වයේ නොකඩවා පැවති ඉහළ ප්‍රසාරණය සහ ඒ අනුව දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ වාතාවරණයක් තුළ සමහර වෙළෙඳපළ වල පොළී අනුපාතිකයන්හි සුළු පහත වැටීමේ නැඹුරුවක් පෙන්නුම් කළද, 1991 දී කෙටි කාලීන පොළී අනුපාතිකයන්ගේ සාමාන්‍ය මට්ටම ඉහළ තලයක පැවතුණි. මේ අනුව කල්පිරීමේ කාලය මාස 3 සිට 12 දක්වා වෙනස් වන භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තැබූ සාමාන්‍ය අනුපාතිකය 1990 දෙසැම්බර් මස සියයට 17.41 - 18.36 පරාසයේ සිට 1991 සැප්තැම්බර් මාසයේදී සියයට 15.79 - 16.87 පරාසයක් දක්වා අඩු වූ නමුත් වර්ෂය අවසානයේදී සියයට 16.33 - 17.43 පරාසයක් දක්වා ඉහළ නැගුණි. මේ අතර, ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි පොළී අනුපාතික වර්ෂය තුළදී සැළකිය යුතු අන්දමින් උච්චාවචනය වුවද, වර්ෂය අවසානයට සියයට 13-27 ක පරාසයක් තුළ එම පොළී අනුපාත ස්ථාවර විය. උද්ධමන පීඩනයේ අඩුවීම සහ භාණ්ඩාගාර බිල්පත් වලට අදල පොළී අනුපාතික සුළු පහත වැටීමට අනුකූලව කෙටි කල් පිරීම් සහිත ස්ථාවර තැන්පතුවල පොළී අනුපාතික පහත වැටිණි. වාණිජ බැංකුවල මාස 3 සහ මාස 6 කල් පිරීම් සහිත තැන්පතුවල උපරිම පොළී අනුපාතික

පිළිවෙලින් සියයට 22.5 සහ සියයට 21 සිට සියයට 18.5 සහ සියයට 18 දක්වා පහත වැටිණි. මාස 12 තැන්පතු සඳහා උපරිම පොළී අනුපාතයන් සියයට 21 සිට සියයට 20 දක්වා අඩුවිය. මේ අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, 1991 ජූලි මාසයේදී එහි ඉතුරුම් තැන්පතු සඳහා පොළී අනුපාතිකයන් ප්‍රතිශත 2.2 කින් අඩු කොට වර්ෂයකට සියයට 14 කරන ලදී. කෙසේ වුවත් ඉතිරි කිරීමේ බැංකුවේ මාස 12-24 තැන්පතු සඳහා පොළී අනුපාතිකය වර්ෂය තුළදී නොවෙනස්ව සියයට 17-18.5 අතර පැවතිණි. පොළි අනුපාතික ව්‍යුහයේ විකෘතිතාවය අඩු කිරීම අරමුණුකොට ගෙන මහ බැංකුව වර්ෂය තුළදී එහි ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වූ පොළි අනුපාතිකයන් ඉහළ දමන ලදී. 1991 ජනවාරි මාසයේදී මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කිරීමේ පියවරක් වශයෙන් මහ බැංකු අත්තිකාරම් සඳහා පොළිය වර්ෂයකට සියයට 15 සිට වර්ෂයකට සියයට 17 දක්වා වැඩි කරන ලදී. දිගු කාලීන පොළි අනුපාතික ස්ථාවරව පැවතියද බොහෝ පොළී අනුපාතික වර්ෂය තුළදී සුළු වශයෙන් ඉහළ නැගිණි.

මූලික වශයෙන් දේශීය ණයෙහි අධික වර්ධනයේ සහ ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රසාරණයේ වේගය නොකඩවා ඉහළ මට්ටමක පැවැතීම නිසා 1991 දී සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් තීව්‍ර කරණ ලදී. උද්ධමන වේගයේ නැඹුරුව යහපත් තත්ත්වයක පැවතියද මූල්‍ය හා ණය ප්‍රසාරණයේ ඉහළ වේගය අතිරේක සංකෝචනාත්මක ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය පෙන්නුම් කළේය. 1991 දී හඳුන්වා දුන් ප්‍රතිපත්තීන්ට මහ බැංකු පොළි අනුපාතිකය ඉහළ දැමීම, ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම වඩා විධිමත් කිරීම, වාණිජ බැංකු සඳහා ඉහළ මුදල් සංචිත අනුපාතයක් පැනවීම සහ භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පොළ තුළින් විවෘත වෙළෙඳ පොළ කටයුතු වේගවත් කිරීම ඇතුළත් විය. මේ අනුව, 1991 ජනවාරි 4 දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 15 සිට වර්ෂයකට සියයට 17 දක්වා ඉහළ නංවන ලදී. මීට අමතරව වාණිජ බැංකු ණයෙහි අධික වර්ධනය ග්‍රහණය කර ගැනීම අරමුණු කොටගෙන, වාණිජ බැංකුවල මුදල් සංචිත අනුපාතය 1991 ජනවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි සියළුම වර්ගයන්හි තැන්පතු වගකීම් සඳහා සියයට 10 සිට සියයට 13 දක්වා වැඩි කරන ලදී. මේ හා සමගින්ම ප්‍රතිපත්තිමය උපකරණයක් වශයෙන් සංචිත අවශ්‍යතාවයේ බලපෑම වැඩි කිරීම අරමුණු කොටගෙන, ශ්‍රී ලංකා භාණ්ඩාගාර බිල්පත්, සංචිත අවශ්‍යතාවල කොටසක් වශයෙන් තබා ගැනීමේ පහසුකම ඉවත් කරන ලදී.

මූල්‍ය ප්‍රතිපත්තිය වෙළෙඳ පොලහිමුඛ කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් වර්ෂය තුළ මූල්‍ය පාලනයේදී විවෘත වෙළෙඳ පොළ කටයුතු මත වැඩි අවධාරණයක් යොමු කරණ ලදී. මහ බැංකුව, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත්, වෙළෙඳ පොළෙහි සතිපතා වෙන්දේසි එසේම පැවැත් වූ අතර, බලධාරීන්ගේ අවම මැදිහත්වීම සහිතව ඒවායේ පොළී අනුපාතිකයන් වෙළෙඳ පොළ තත්ත්වයන් මත තීරණය වීමට ඉඩ හරින ලදී. භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පොලෙහි ක්‍රියාකාරිත්වයේ වෙළෙඳ පොළ ස්වරූපය තවදුරටත් උනන්දු කරවීම සඳහා ප්‍රාථමික වෙන්දේසියේ ලංසු තැබීමෙන් ග්‍රාහක මූලාශ්‍ර ඉවත් කරන ලද අතර "ටැප් ක්‍රමය" (Tap System) තනි පුද්ගලයන්ට පමණක් සීමා කරන ලදී. මේ අනුව, 1991 අගෝස්තු මස සිට ග්‍රාහක මූලාශ්‍ර සඳහා භාණ්ඩාගාර බිල්පත් වෙන් කිරීම, පොදු වෙන්දේසියේ තීරණය වන බර තැබූ සාමාන්‍ය පොළී අනුපාතිකයන් මත පදනම් කර ගන්නා ලදී.

භාණ්ඩාගාර බිල්පත්වල අලෙවිය උනන්දු කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ සඳහා ආකර්ශනීය වට්ටම් අනුපාතිකයන් ප්‍රදානය කරන ලදී. වඩාත් කාර්යක්ෂම ද්විතීය වෙළඳ පොළක් ඇති කිරීම අරමුණු කොට ගෙන, වට්ටම් කළ සහ ප්‍රති වට්ටම් කළ අනුපාතිකයන් අතර වෙනස ප්‍රතිශත ඒකක 2 දක්වා ප්‍රතිශත ඒකක 3 කින් අඩු කරන ලදී. ද්විතීය වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයේ පුළුල් වීම පිළිබිඹු කරමින් වර්ෂය තුළදී ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළෙහි දළ විකුණුම් සියයට 19 කින් ඉහළ ගිය අතර, දළ ගැණුම් සියයට 74 කින් ඉහළ නැගුණි.

භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළෙහි වැඩි දියුණු කිරීම සඳහා වූ අනුග්‍රාහකත්වය පිළිබිඹු කරමින් බැංකු නොවන අංශය විසින් දැරූ භාණ්ඩාගාර බිල්පත්, 1990 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 22,904 සිට 1991 දෙසැම්බර් මාසයේදී රුපියල් දශ ලක්ෂ 25,122 දක්වා ඉහළ නැගුණේ,

එම අංශය විසින් දරනු ලැබූ සමුච්චිත බිල්පත්හි දායකත්වය, සියයට 37.4 සිට සියයට 38.7 දක්වා ඉහළ නංවමිනි. කෙසේ වුවද මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම්, 1991 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශ ලක්ෂ 27,034 සිට රුපියල් දශ ලක්ෂ 29,854 දක්වා වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාණිජ බැංකුවල භාණ්ඩාගාර බිල්පත් දැරීම්වල රුපියල් දශ ලක්ෂ 1,338 ක අඩුවීම සහ වසරේ අවසාන කාර්තුවේදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,500 ක නව නිකුතුයි.

මූල්‍ය ස්ථාවරත්වය සහ පොළී අනුපාතිකයන් කෙරෙහි ප්‍රතිමූල්‍ය පහසුකම්වල ඇති අයහපත් බලපෑම අවම කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් එහි ප්‍රතිමූල්‍ය පහසුකම් වඩා විධිමත් කිරීම සඳහා පියවරයන් කිහිපයක් අනුගමනය කරන ලදී. මෙම විධිමත් කිරීමේ මිනුම්වලට ස්ථාපිත වූ සාම්ප්‍රදායික අපනයන සඳහා ලබා දුන් ප්‍රතිමූල්‍ය පහසුකම් ක්‍රමයෙන් අඩු කිරීම, විශේෂ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයන් ඉවත් කිරීම, අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් කාණ්ඩ 2 යටතේ ලබා දුන් ප්‍රතිමූල්‍ය පහසුකම්, වැඩි එකතු කළ වටිනාකමක් ඇති අපනයන සහ පුරෝගාමී අපනයන සඳහා සීමාකිරීම සහ සීමිත ණය පහසුකම්, වැඩි ණය ගැනුම්කරුවන් ප්‍රමාණයක් අතර බෙද හැරීම අරමුණු කොට ගෙන එම ණය පහසුකම් එක් අපනයන කරුවෙකුට එක් අපනයන භාන්ඩයක් සඳහා සීමාකිරීම ද කරනු ලැබීය. පොළී අනුපාතික පද්ධතියේ විකෘතිතාවය අඩුකිරීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වූ පොළී අනුපාතිකයන්ද වෙළෙඳ පොළ අනුපාතිකයන්ට අනුකූලව ගැලපීමට පියවර ගන්නා ලදී. මේ අනුව සියළුම ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වූ පොළී අනුපාතිකයන්, 1991 ජනවාරි මස ප්‍රතිශත ඒකක 2 කින්ද, 1991 අගෝස්තු මස ප්‍රතිශත ඒකක 2 කින් ද ඉහළ නැංවූ අතර, 1991 දෙසැම්බර් මස සිට අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් කාණ්ඩ 1 සහ 2 යටතේ සහ මිල සහතික ක්‍රමය යටතේ දෙන ප්‍රතිමූල්‍ය ණය සඳහා තවත් ප්‍රතිශත ඒකක 2 ක් ඉහළ නංවන ලදී.

ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ තීරණාත්මක ඉදිරි පියවරක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය ලෝක ආර්ථිකය හා වැඩි වැඩියෙන් ඒකාබද්ධ කිරීමේ අරමුණින් යුතුව ආර්ථික ප්‍රතිසංස්කරණ සහ නිදහස් කරණ වැඩපිළිවෙල තවදුරටත් ඉදිරියට ගෙනයාම මෑත කාලීන ආර්ථික ප්‍රතිපත්තියේ කැපී පෙනෙන අංගයක් විය. මෑත ඉතිහාසයේ හඳුන්වා දෙන ලද නිදහස් ආර්ථිකකරණ / ප්‍රතිසංස්කරණ ක්‍රියා මාර්ග අතර : (අ) විදේශීය ආයෝජන සඳහා පුළුල් දිරිගැන්වීම්/පහසුකම් සැළසීම. (ආ) විදේශ විනිමය පාලනයන් තවදුරටත් ලිහිල් කිරීම, (ඇ) විනිමය පාලන කටයුතු බලයලත් නියෝජිතයන් වෙත තවදුරටත් පවරා දීම, (ඈ) වෙළෙඳ හා කාර්මික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ සීමාවන් ලිහිල් කිරීම, සහ (ඉ) නේවාසික ව්‍යවසායයන් සඳහා විදේශීය ව්‍යවහාර මුදල් බැංකු කටයුතු පුළුල් කිරීම ආදිය වේ.

බාහිරාවලෝකණ සංවර්ධන උපාය මාර්ගයන් තුළ, මෙම ප්‍රතිසංස්කරණ සහ නිදහස් ආර්ථිකරණ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයනු ලැබුවේ සීමාකාරී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් මත මූලිකව පදනම් වූ සාර්ව ආර්ථික ස්ථායිකරණය අරමුණු කොටගත් සමස්ත ප්‍රතිපත්ති රාමුවක් තුළය. මීට අමතරව, පෞද්ගලික අංශය මුල් කොටගත් සංවර්ධනයක් සඳහා ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් පරිපාලනමය සහ නීරු බදු ප්‍රතිසංස්කරණ, රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් පෞද්ගලිකකරණය කිරීම සහ පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම ආදී අංගයන්ගෙන් යුත් කඩිනම් ව්‍යුහාත්මක වෙනස් කම් වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මකව පැවතිණි.

පෞද්ගලික විදේශ ආයෝජන මගින් පිටුබලය ලත් පෞද්ගලික අංශයේ පුරෝගාමීත්වය මත පදනම් වූ සංවර්ධන උපාය මාර්ගය සම්බන්ධයෙන් සලකා බලන කල, රට තුළට පෞද්ගලික විදේශීය ආයෝජන දිරි ගැන්වීම සඳහා ගන්නා ලද යම් යම් පරිපාලනමය හා ප්‍රතිපත්තිමය වෙනස් කම් පිළිබඳව කෙටියෙන් සලකා බැලීම වැදගත්ය. පළමුවෙන්ම, 1990 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) සහ විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි. ආ.උ.ක.) ඒකාබද්ධ කොට එය ම.කො.ආ.කො. තුළ ක්‍රියාත්මක වන විදේශීය ආයෝජන ප්‍රවර්ධනය සඳහා වූ ඒකීය අධිකාරියක් බවට පත් කරන ලදී. මෙහි අරමුණ වූයේ ආයෝජන ක්‍රියා පටිපාටිය වඩා සරල සහ යථානුරූපී කිරීමයි. 1990 ජූනි මාසයේදී අනේවාසිකයන් විසින් ශ්‍රී ලාංකික සමාගම් වල කොටස් මිලට ගැනීමේදී ගෙවිය යුතු වූ සියයට සියයක් වූ පැවරුම් බද්ද එබඳු ආයතනවල නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට 40 ක් දක්වා [illegible]හස් කරන ලදී. ඊට අනුරූපව, විදේශීය

ආයෝජන සම්බන්ධයෙන් වූ විදේශීය විනිමය පාලනයන් ලිහිල් කරනු ලැබූ අතර අනුමත කරන ලද පිටරට සහ ප්‍රදේශීය අරමුදල්වලට ද විදේශීය නියෝජිත ආයතනයන්ටද, විදේශිකයනටද ලංකාවේ ලියා පදිංචි සමාගම්වල නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට 40 දක්වා ආයෝජනය කිරීමට අවසර ලැබුණි. 1990 නොවැම්බර් මස රජය විසින් නිකුත් කළ සිය ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ආර්ථිකයේ බොහෝ අංශ සම්බන්ධයෙන් විදේශීය කොටස් ප්‍රාග්ධනයේ දායකත්වය සඳහා නිරායාසයෙන්ම සියයට සියයක් දක්වා ලබා ගැනීමට ඉඩතල සලසා දෙනු ලැබිණි. මෙම මස තුළදීම, වසරකට වැඩි කලක් සඳහා වන කොටස් විකුණුම් මත පැනවූ ප්‍රාග්ධන ලැබීම් බද්ද මෙන්ම කොටස් නිකුත් කිරීම සහ පැවරීම මත වූ මුද්දර ගාස්තු ද ඉවත් කරනු ලැබීය. 1991 ජනවාරි මස කැබිනට් ඇමතිවරුන්ගෙන් සමන්විත උප කමිටුවක් පත් කරනු ලැබූ අතර ඒ මගින් සතිපතා රැස්වීම් පැවැත්වීමටත්, ම.කො.ආ.කො. යටතේ වූ විදේශීය සෘජු ආයෝජන අනුමත කිරීම් සම්බන්ධීකරණය/කාර්යක්ෂම කිරීමටත් පියවර ගන්නා ලදී. මෙම මස තුළදීම, ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සහ කාර්මීකකරණය සඳහා වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම සඳහා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් සහ ප්‍රමුඛ ව්‍යාපාරිකයන්ගෙන් සමන්විත කාර්මිකකරණ කොමිසමක් පිහිටුවන ලදී. 1991 අප්‍රේල් මස ලැයිස්තුගත කොටස් සඳහා ගෙවන ලද ලාභාංශ මත පැනවූ රඳවා ගැනීමේ බද්ද සහ ධන බද්ද ඉවත් කරන ලදී.

1991 පෙබරවාරි මස, විදේශීය ආයෝජකයන් සඳහා "ආරාධිත නේවාසිකත්ව ක්‍රමය" ක්‍රියාත්මක කරන ලද අතර, මේ යටතේ නිශ්චිත මූල්‍යමය බැඳීම්වලට යටත්ව වසර 5ක කාලයක් සඳහා විදේශීය ආයෝජකයන්ට සහ විශේෂඥයන්ට ශ්‍රී ලංකාවේ නේවාසික හිමිකම ලැබිණි. පස් වසරක කාලය ඉක්මවූ පසුව රජයේ තීරණය මත මෙම හිමිකම පුරවැසිභාවයට පරිවර්තනය කිරීමට හැකිය. 1991 මාර්තු මස සිට උපදේශක සේවා, බලපත්‍ර ලබා දීම, රෝයල්ටි සහ පාලන ගාස්තු සඳහා ශ්‍රී ලංකාවේ සමාගම්වල ප්‍රේෂණ සඳහා අනුමැතිය දීම බලයලත් විදේශ විනිමය නියෝජිතයන්ට පවරා දෙන ලදී. අනේවාසික විදේශීය පුරවැසියන් සහ සමාගම් සතු "රැඳවුම් ගිණුම්" වල වූ අරමුදල් විදේශ ගත කිරීමටද අවසර ලැබිණි. 1991 ජුනි මස, ම.කො.ආ.කො. මගින් පුළුල් දිරිගැන්වීම් සහිතව ශ්‍රී ලංකාවේ තුන්වන අපනයන සැකසුම් කලාපය කොග්ගල පිහිටුවන ලදී.

ඉහත සඳහන් ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ පහසුකම් වල අරමුණ වූයේ රටෙහි සංවර්ධන ප්‍රයත්නයේදී විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනයේ දායකත්වය ඉහළ නැංවීමට සුදුසු පරිසරයක් සකස් කිරීමය. රටෙහි ප්‍රධාන ආර්ථික ප්‍රශ්න සඳහා විසඳුමක් ලෙස ශක්තිමත් නිර්යාතාභිමුඛ පෞද්ගලික අංශය මුල් කොටගත් සංවර්ධන උපාය මාර්ගයක් අත්‍යාවශ්‍ය බව අවබෝධ වී තිබිණි. මින් අර්ථවත් වන්නේ ආයෝජන පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අතීතයේ පැවතියාට වඩා අත්‍යාවශ්‍යයෙන්ම වැදගත් කාර්යභාරයක් පුද්ගලික විදේශීය ප්‍රාග්ධනය සතුවන බවයි. මේ අනුව රටෙහි ඉතුරුම් සහ ආයෝජන අතර පරතරය ආනාගතයේදී පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් මගින් සපුරා ලනු ඇතැයි අපේක්ෂා කෙරිණි. මේ අභිමතාර්ථය ඉටු කර ගැනීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳ පොළේ තත්ත්වය වැඩි දියුණු කිරීමට ප්‍රධාන ක්‍රියා මාර්ග කිහිපයක් ගන්නා ලදී. අඩු ආදායම් මට්ටම්, කුඩා පරිමාන ව්‍යවසායයන් සහ ආයෝජන පාලනය කිරීමේ රජයේ අභිමතය යන කරුණු මගින් අතීතයේදී ප්‍රාග්ධන වෙළඳ පොළේ සංවර්ධනයට බාධා සිදුවුණි. එසේ වුවද, 1989 සිට 1991 දක්වා කාලපරිච්ඡේදය තුළ මෙම තත්ත්වය සැළකිය යුතු ලෙස වෙනස් විය. මූල්‍ය වෙළෙඳ පළ ප්‍රසාරණය වීමත් සමගම, ඒවායේ ආයෝජනයද ඉහළ නැගිණි. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට විදේශීය ගෙවීම් ක්‍රමයේ නිදහස් කරණයත් නිදහස් වෙළෙඳ පළ ප්‍රතිපත්තීන් මගින් සිදු වූ දියුණුවත් මහත් පිටුබලයක් විය. පෞද්ගලික අංශයේ සමාගම්වල වර්ධනයත් රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් පෞද්ගලිකකරණය කිරීමත් සමගම ප්‍රාග්ධන වෙළෙඳ පොළේ කටයුතුවල ඉහළ යාමක් සිදුවිය. "වර්ධනය වෙමින් පවත්නා පෞද්ගලික අංශයේ මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීමේදී "කොටස් වෙළෙඳ පළ" ක්‍රියාකාරී මාධ්‍යයක් ලෙස කැපී පෙනුණි. මෙය මෑත අතීතයේ ප්‍රාග්ධන නිකුතු සඳහා වූ අධි දායකත්වය තුලින් නිරූපනය වූ කොටස් වෙළෙඳ පලේ සීඝ්‍ර වර්ධනයටත් කොටස් ප්‍රාග්ධනය සඳහා වන ඉල්ලුමේ ආකර්ශණීය ප්‍රසාරණයටත් මග සැලසීය.

පෞද්ගලික අංශයේ පුරෝගාමීත්වය මත පදනම්වූ තියුණු ආයෝජන ප්‍රසාරණයක් වර්තමාන ආර්ථිකය හමුවේ ඇත. මේ සම්බන්ධයෙන් 1991 අවසානයේදී වැදගත් පියවරක් ගන්නා

ලදී. එනම් රටෙහි විදේශීය ආයෝජන ප්‍රවර්ධනයේ එකම අධිකාරිය වන ම.කො.ආ.කො. මගින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා ආයෝජන සමුළුව" යි. වර්තමානයේදී ශ්‍රී ලංකාව විදේශීය ආයෝජකයන් සඳහා ඉතා ආකර්ෂනීය දිරිගැන්වීම් පෙළක් පිරිනමනු ලබයි. මීට අයත්වන දිරිගැන්වීම් අතර අවුරුදු පහළොවක් දක්වා වූ බදු නිදහස් කාලය, සියයට සියයක් දක්වා කොටස් වල විදේශීය අයිතිය, විනිමය පාලනයන්ගෙන් නිදහස් කිරීම, ආනයන යෙදවුම් සඳහා බදු නිදහස් කිරීම, ගාස්තු රහිත කොටස් හුවමාරුව ආදිය වේ. එමෙන්ම, බදු නිදහස් කාලසීමාව තුළ යෝජනා ක්‍රමවල සේවය කරන අනේවාසිකයන් සඳහා අවශ්‍ය බදු අය නොකිරීම සහ එම කාලසීමාව තුළ නේවාසික කොටස් හිමියන්ගේ ලාභාංශ බද්දෙන් නිදහස් කිරීම සහ අනේවාසිකයන් සඳහා යෝජනා ක්‍රමයේ මුළු ජීව කාලය සඳහාම බදු වලින් නිදහස් කිරීමද මීට අයත්ය.

රටෙහි සංවර්ධන ප්‍රයත්නයන්ට ආධාර වශයෙන් විශාල ලෙස විදේශීය ප්‍රාග්ධන ලැබීම් අපේක්ෂිත වාතාවරණයක් හමුවේ විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනයට අදාල මූලික කරුණු කිහිපයක් පිළිබඳව සලකා බැලීම කාලෝචිතය. ආර්ථික සංවර්ධනයේලා විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනයේ කාර්යභාරය, සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නය තරමටම දීර්ඝ කාලයක් තිස්සේ විවාදයට භාජනය වූ විෂයයකි. විදේශීය ප්‍රාග්ධන ගලා ඒම් හා සම්බන්ධ යහපත් මෙන්ම අයහපත් ප්‍රතිවිපාක දක්නට ලැබෙන අතර, ප්‍රාග්ධනය ලැබෙන රටට සාධාරණ මට්ටමක ප්‍රතිලාභ අයත්වීම සහතික කෙරෙන අන්දමට නිවැරදි ප්‍රතිපත්ති සහ ආරක්ෂණයන් පවත්වා ගෙන යන්නේ නම්, යහපත් ප්‍රතිඵලයන් හි බලපෑම මගින් අයහපත් ප්‍රතිවිපාකවල බලපෑම් බොහෝ දුරට සමනය වන බවට මතයක් පවතී.

යහපත් ප්‍රතිවිපාක පිළිබඳව සළකන කල පළමුවෙන්ම විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් මගින් දේශීය ඉතුරුම් වල ඌණතාවය සපුරාලීමෙන් අතිරේක ආයෝජන හැකියාවන් සලසා දෙන අතරම, දේශීය ඉතුරුම් වල හැකියාවන් ඉක්මවා ආයෝජන මට්ටම වර්ධනය කරනු ලැබේ. දෙවනුව, විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම් හා සමගම ආර්ථිකයේ අතිකුත් අංශවලට යහපත් අතුරු ඵලයන් ලබා දීම මගින් දේශීය නිෂ්පාදිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අවශ්‍යම වූ තාක්ෂණික සහ කළමනාකරණ හැකියාවන් ද ලබා ගැනීමට පුළුවන. තෙවනුව, දේශීය ආර්ථිකය හා බාහිර ලොව අතර නව වෙළඳ සම්බන්ධතා ගොඩ නැංවීමේ හැකියාව විදේශීය පෞද්ගලික අංශය සතුව පවතින අතර එය ආර්ථික වර්ධනයට බාධාකාරී වන වෙළඳ පළ සීමා කරණ ඉවත් කරලීමට උපකාරි වේ. සිව්වනුව, විදේශීය පෞද්ගලික ආයෝජන මගින් රැකියා විරහිත ශ්‍රම බලකායෙන් සෑහෙන කොටසකට ක්ෂණික රැකියා අවස්ථා සලසා දිය හැකි අතර, දේශපාලනමය හා සමාජමය පීඩනයන් යම්තාක් දුරකට සමනය කිරීමටද මෙය හේතු වේ. පසුවනුව, නිවැරදිව ප්‍රතිපත්ති ක්‍රියාත්මක පවතී නම්, විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් හේතු කොට ගෙන විශේෂයෙන්ම කොටස් වෙළෙඳ පළේ ආයෝජනයන් මගින් විදේශීය විනිමය හා ප්‍රාග්ධන වෙළඳ පළ කටයුතු වඩා ක්‍රියාශීලි කිරීමටත් ඒවායේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත් හැකියාව ලැබේ.

පුළුල් වූ ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ශක්තිමත් බාහිර වෙළඳ අංශය හේතුකොට ගෙන ඇතිවන වෙනත් සෘජු සහ වක්‍ර වාසිදායක ප්‍රතිවිපාක ද වේ. විශේෂයෙන්ම නිෂ්පාදිත භාණ්ඩ ප්‍රසාරණය තුළින් අපනයන අංශය විවිධාංගීකරණය කිරීමෙන් ප්‍රාථමික භාණ්ඩවල මිළ විශාල ලෙස පහත වැටීම වැනි අහිතකර බාහිර කම්පනයන්හි ප්‍රතිවිපාක වලට ඔරොත්තු දීමේ හැකියාවක් සහිත ආර්ථිකයක් බිහි කිරීමට හැකිවේ. අවසාන වශයෙන් පෞද්ගලික විදේශීය ප්‍රාග්ධනය මගින් විදේශීය ප්‍රාග්ධනය ලබා ගැනීමේ ප්‍රධාන වාසිය වන්නේ සලකා බලන ව්‍යවසායයන් ප්‍රතිලාභ ජනනය නොකරනතාක් කල් ගෙවුම් ශේෂය හා බැඳුණු සේවා ආපසු ගෙවීම් පිළිබඳ අවශ්‍යතාවන්ගෙන් මිදීම හේතුකොට ගෙන ණය උත්පාදනය කිරීමේ තත්ත්වයක් පෞද්ගලික විදේශීය ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ඇති නොවීමයි.

ඉහළ නැගුණ ප්‍රාග්ධන ගලා ඒම්වල සෘජු ප්‍රතිඵලයක් ලෙසම නොවුනද, විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනය දිරිගැන්වීම සම්බන්ධයෙන් බොහෝ විට අනුගමනය කරනු ලබන විවිධ උපක්‍රම හේතුකොට ගෙන විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනය හා බැඳුණු බොහෝ අයහපත් අංග ද දක්නට ඇත. මෙබඳු ප්‍රාග්ධන ගලා ඒම්වලට ප්‍රතිපක්ෂව සැලකිල්ලට බඳුන් වූ ප්‍රධාන කරුණු

වලින් එකක් වන්නේ විදේශීය හිමිකම් සහ ජාතියේ ආර්ථික ජීවිතය කෙරෙහි වර්ධනය වන විදේශීය ආධිපත්‍යයේ බලපෑම පිළිබඳ ව වූ දෘෂ්ටිමය නොකැමැත්තයි. එමෙන්ම සෘජු විදේශීය ආයෝජනවල හේතුවෙන් ඇති වන අහිතකර තරගකාරිත්වය නිසා දැනට පවතින හා ඉදිරියේ දී ඇතිවිය හැකි සමහර දේශීය ව්‍යවසායකයන් ගේ අවස්ථා අහිමි වී යා හැකිය. කෙසේ වුවද, සුපරීක්ෂාකාරී ලෙස සැලසුම් කළ දිරිගැන්වීම් පෙළක් උපයෝගී කොටගෙන දේශීය ආයෝජකයන්ට එරෙහිව ඇතිවන ප්‍රතිපත්තිමය විෂමතාවන් අඩු කිරීම මගින් මෙබඳු අයහපත් ප්‍රතිවිපාක අවම කර ගැනීමට පුළුවන. එමෙන්ම, එකිනෙකට සුසංයෝගී වන ප්‍රතිපත්ති මාලාවකින් සහ ප්‍රමාණවත් ආරක්ෂණයන්ගෙන් තොරව නේවාසිකයන් විසින් කරනු ලබන දැඩි බාහිර ණය ගැනුම්වලින් පිටුබලය ලත් මහා පරිමාන විදේශීය ප්‍රාග්ධන ලැබීම් හේතු කොට ගෙන මූල්‍ය කළමනාකරණය ඉතා දුෂ්කර කර්තව්‍යයක් වනු ඇත.

එබැවින්, විදේශීය ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා කෙබඳු මට්ටමක දිරිගැන්වීම් කළ යුතුද යන ප්‍රශ්නය පැනනගී. ආයෝජන ප්‍රතිලාභී රටක් අනෙකුත් ප්‍රාග්ධන ආනයනික රටවල් හා තරග කළ යුතු නිසා විදේශීය ආයෝජකයින් තම රටට ඇද ගැනීම සඳහා මෙවැනි සානුබල ලබාදීම අවශ්‍ය වේ. කෙසේ වුවද, විදේශීය ප්‍රාග්ධන ආයෝජනය තුළින් ඇති වන දෙන ලද ස්ථාවර නිෂ්පාදන ප්‍රමාණය සලකන කළ විදේශීය ආයෝජකයින් වෙත ලබා දෙන සහනයන් විශේෂයෙන් බදු නිදහස් කිරීම් සහ සහනදායී බැංකු ණය ආදී සහනයන් වඩ වඩා ලබාදීමේ හේතුවෙන් ආයෝජන ප්‍රතිලාභී රටකට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ අඩු වේ. අනෙක් අතට දෙන ලද ආයෝජන පරිමාව තුළින් ආයෝජන ප්‍රතිලාභී රටකට උපරිම ආර්ථික ප්‍රතිලාභ ලැබීමට නම් විදේශීය ආයෝජකයින්ට දෙනු ලබන මෙම විශේෂ සහනයන් අත්‍යාවශ්‍යයෙන්ම ප්‍රාමාණික සහ සාපේක්ෂව කෙටි කාලීන විය යුතුයි. එමනිසා ඉතිරිකිරීම් ආයෝජන පරතරය අඩු කිරීමේලා විදේශීය ප්‍රාග්ධනය රට තුළට ඇද ගැනීමට කටයුතු කරන අතරම ප්‍රමාණය ඉක්මවා සහනයන් ප්‍රදානය කිරීම මග හැරිය යුතුයි.

අනෙක් ගැටළුව වනුයේ කුමන වර්ගයේ ආයෝජන රට තුළට ලබා ගත යුතුද යන්නයි. දියුණු වෙමින් පවතින රටවල අවශ්‍යතාවය වනුයේ තම සංවර්ධන ක්‍රියාදාමයෙහි ගැටලු නිරාකාරණය කිරීමේලා දිගුකාලීන දායකත්වයක් ලබා දිය හැකි කර්මාන්ත ඇති කිරීමයි. එක් එක් වෙළෙඳ පොළ තත්ත්වයන්ගෙන් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට ස්ථාපිත කරන්නා වූ සහ නිර්ලෝභී සහන කාලය අවසානවත්ම වෙනත් තැනක පහසුවෙන් ස්ථානගත කළ හැකි කර්මාන්තයන් පිහිටුවීම අධෛර්යමත් කළ යුතුය. කොටස් ද්‍රවශීලතාවය හා ලැයිස්තුගත සමාගම් වැඩි නොවන්නේ නම් කොටස් වෙළඳ පොළෙහි පවතින අධි ඉල්ලුම පමණක් අරමුණු කොට ගෙන විශාල ප්‍රාග්ධන ප්‍රමාණයක් ගලා ඒම ධෛර්යමත් කිරීමද අර්ථවත් නොවේ. ඒ වෙනුවට නව නිෂ්පාදන ව්‍යවසායයන්හී හා නව භාණ්ඩ නිෂ්පාදන අංශයන්හි සෘජු ආයෝජන වශයෙන් පෞද්ගලික ප්‍රාග්ධනය ගලා ඒම මෑත අනාගතයේදී සිදු විය යුතුය.

රට තුළ විශාල වශයෙන් පුද්ගලික ප්‍රාග්ධනය ගලා ඒම දිරිගැන්වීම සඳහා සුදුසු පරිසරයක් සකස් කරන අතරම මෙම උපාය මාර්ගය අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වනුයේ නැවත සීඝ්‍රයෙන් වැඩි වන උද්ධමනයකට ඉඩ නොදීමත් පාලනය කළ නොහැකි ගෙවුම් ශේෂ, ජංගම ගිණුම් ශේෂයන් ඇති නොවන ආකාරයටත් ස්ථායී සාර්ව ආර්ථික පරිසරයක් ඇති කිරීමයි. මේ සම්බන්ධයෙන් 1991 වසර තුළ පසු බැස්මක් දක්නට ලැබුණ අතර එය මූල්‍ය ප්‍රසාරණ අනුපාතයේ සීග්‍ර වර්ධනයක් ද මෑත කාලයේ ක්‍රියාත්මක කරන ලද සංශෝධන උත්සාහයන් පසු බැස්මකට ලක් කරමින් සිදු වූ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයෙහි දුර්වලතා ද සමග සිදු විය. සාර්ව ආර්ථික ස්ථායීකරණය අවශ්‍ය ප්‍රමාණයට ඇති කිරීම සඳහා පොදු උත්සාහයක් ගැනීම අවශ්‍ය බව සඳහන් කිරීම උචිත වේ. මෙම අවශ්‍යතාවය සඳහා මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්හි සංයමයක් ඇති කිරීම සඳහා ඉදිරි කාලයේදී අඛණ්ඩ උත්සාහයක් ගැනීම ඉතා වැදගත් වේ.